# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,165 - 2020 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2020.02.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 350 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 389 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 මාර්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ඃ

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය

### ලේකම් හා ගණකාධිකාරි තනතුර

මෙම සංගමයේ ලේකම් හා ගණකාධිකාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරා ඇති රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ත්‍රී/පුරුෂ දෙපර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **සුදුසුකම්**
   කළමණාකරණ සේවා නිලධාරී සේවයේ අධිපන්තියේ නිලධාරියකු හෝ I පන්තියේ නිලධාරියකු වීම.

2. **අවශ්‍යතා**
   - 2.1 කොළඹට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය,
   - 2.2 2020.04.01 වැනි දිනට වයස අවු. 55ට වැඩි නොවීම.
   - 2.3 රාජ්‍ය සේවයේ වසර 15ට නොඅඩු සේවා කාලයක් තිබීම.
   - 2.4 ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රාමාණික දැනුමක්/හැකියාවක් තිබීම.
   - 2.5 පරිගණක සාක්ෂරතාවය හා Internet and Email භාවිත කිරීමේ හැකියාව
   - 2.6 ඉංග්‍රීසි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව
   - 2.7 දෙමළ භාෂාව දැන සිටීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ඇත.
   - 2.8 අවම වසර 2ක ද්විතීයන පදනම යටතේ නිදහස් කිරීමට සේවා ප්‍රධානී/විනය බලධාරීගේ කැමැත්ත

3. වැටුප
   - 3.1 අයදුම්කරු රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුර යටතේ ලබන මූලික වැටුප හා අනුමත සියලු දීමනා
   - 3.2 සංගමය විසින් ලබා දෙන මූලික වැටුපෙන් 50% ක් වූ දීමනාව

4. රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම (අංක 1589/30 දරන 2009 පෙබරවාරි මස 20 දිනැති ***අති විශෙෂ ගැසට් පත්‍රය*** අනුව)

   4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික (I කාණ්ඩයේ) රීති 142 සමග කියවිය යුතු 143 වන රීතිය අනුව - පරිශිෂ්ට අංක 10 ප්‍රකාර - නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ආකෘතිය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය ද ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. (www.psc.gov.lk වෙබ් අඩවියෙන් ආකෘතිය භාගත කළ හැක.)

   2020.03.13 වැනි දින දහවල් 12.00 ට පෙර ලැබෙන සේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් (ඉහත 2.7 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එන්. එම්. විජේරත්න,
සභාපති.

2020 පෙබරවාරි මස 28 වැනි දින,
රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය,
අංක 65/1 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02,
දුරකතන අංක : 011-2434598, 2473633
ෆැක්ස් : 0112434212
වෙබ් අඩවිය : www.goba.lk

02-687

## ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව

### ආධුනික ශිෂ්‍යභට නිළධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිළධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිළධාරීන් සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිළධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී. :-

(අ) නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි)
(ආ) කාර්මික ඉංජිනේරු ශාඛාව (පිරිමි/කාන්තා)
(ඇ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව (පිරිමි)
(ඈ) සැපයුම් ශාඛාව (පිරිමි/කාන්තා)
(ඉ) පරිපාලන ශාඛාව (පිරිමි)
(ඊ) පරිපාලන රෙජිමේන්තු ශාඛාව (පිරිමි/කාන්තා)
(උ) මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) (පිරිමි)
(ඌ) විනයාරක්ෂක ශාඛාව (පිරිමි)
(එ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව (පිරිමි)
(ඒ) පාලන තූර්යවාදක ශාඛාව (පිරිමි)

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

3. **විශේෂ සුදුසුකම් (උපාධි වැඩසටහන)** :-

Bsc (Aviation Studies) උපාධි වැඩ සටහන යටතේ ඇතුල්වීමේ සුදුසුකම් (ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිළිගත්). උපාධි සහිත වැඩසටහන සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් තම අයදුම්පත්‍රයේ අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල සඳහන් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන වග ද සඳහන් කළ යුතුය.

(අ) *නියමු පොදු රාජකාරි/මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක) ශාඛාවන්* :
අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව/ජීව විද්‍යා විෂය ධාරාව/තාක්ෂණවේදය යන විෂය ධාරාවන්ගෙන් (අදළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ආ) *කාර්මික (ගුවන් යානා) ඉංජිනේරු/විද්‍යුත් ඉංජිනේරු ශාඛාවන්* :
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) *සැපයුම්/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු/විනයාරක්ෂක ශාඛාවන්* :
අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුත අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික/ජීව විද්‍යා/වාණිජ්‍ය/තාක්ෂණවේදය/කලා යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි. (විනයාරක්ෂක ශාඛාව සඳහා අයදුම් කරන්නන් හට අඩි 05 අඟල් 08කට වඩා උසකින් යුක්ත වීම සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.)

(ඈ) *තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව* :
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස.(උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් භෞතික

විද්‍යා විෂය ධාරාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සමග තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් (අදාළ පරිදි) විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඉ) *පාලන තූර්යවාදක ශාඛාව*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සහ බටහිර සංගීතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතු අතර (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් කලා විෂය ධාරාවෙන් බටහිර සංගීතය හා පෙරදිග සංගීතය යන විෂයයන් දෙකට සම්මාන සාමාර්ථ දෙකක්ද ඇතුලත්ව විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුයි. තවද වෙනත් විෂය ධාරාවන් මගින් අ.පො.ස. (උ.පෙළ) හදරා ඇති අයවලුන් එක් වරකදී විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම සහ රාජකීය සංගීත පාසැල, ට්‍රිනිටි විද්‍යාලය ලන්ඩන්, ලන්ඩන් සංගීත විද්‍යාලයේ හෝ වෙනත් ජාත්‍යන්තරව පිළිගත් සංගීත පාසැලක 5 වන හෝ ඉහළ ශ්‍රේණියේ න්‍යායික හෝ ප්‍රායෝගික විභාගයක් සමත් වී තිබීම හෝ බටහිර තූර්ය වාදක කණ්ඩායමක/බටහිර ශිෂ්‍ය භට තූර්ය වාදක කණ්ඩායමක වසර තුනක හෝ ඊට වඩා වැඩි පළපුරුද්දක් තිබිය යුතුයි.

සුසර භාණ්ඩ (woodwind, Brass wind) සහ තාල වාද්‍ය භාණ්ඩ (Percussion) වාදනය කිරීමේ හැකියාව තිබීම, බටහිර සංගීත කණ්ඩායම් තූර්ය වාදන කණ්ඩායම් සඳහා ස්වර ප්‍රස්ථාර ලිවීමේ සහ නිර්මාණ කිරීමේ හැකියාව තිබීම, බටහිර සංගීත කණ්ඩායම්/තූර්‍ය වාදන කණ්ඩායම් පාලනය කිරීම සහ මෙහෙයවීම (Conducting) හැකියාව තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.

4. විශේෂ සුදුසුකම් (උපාධි රහිත වැඩසටහන)
නියමු පොදු රාජකාරි/පරිපාලන/පරිපාලන රෙජිමේන්තු ශාඛාවන්

අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටිය යුතුයි. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර)

5. විශේෂ සටහන් :- ජාත්‍යන්තර පාසල් වල ඉගෙන ගත් (Pearson/Edexcel - International Ordinary/Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6. *අනෙකුත් සුදුසුකම්* : අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (ආ) | වයස | : | 2020 ජූලි මස 15 වන දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | : | පිරිමි - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6කට නොඅඩු විය යුතුයි).<br>කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4කට නොඅඩු විය යුතුයි). |
| (ඈ) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 |

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර(කි. ග්‍රෑ.)}}{\text{උස(මී)}^{2}}$$

| | | | |
|---|---|---|---|
| (ඉ) | පපුව | : | (පිරිමි) අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ඨිය | : | සීපී 2 |

( උ) දෘෂ්ඨී තීක්‍ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිත)

(ඌ) සිවිල් තත්ත්වය : අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේදී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

7. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

8. ඉහත සඳහන් 3 සහ 4 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

9. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති සුදුසුකම් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුද සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

10. *සේවා කොන්දේසි* :

(අ) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව සාර්ථකව නිමවීමෙන් පසු ඔහු/ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිළයෙන් වෙනස්ව නියමු නිලධාරි නිළයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සුදානමින් සිටිය යුතුයි.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන්පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(ඈ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුද භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ඌ) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) සහ (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(එ) තෙවන සහ සිව්වන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්‍ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත්වන නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉහත පරීක්ෂණයන්ගෙන් සමත්වන්නන් නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා කැඳවනු

ලැබේ. තවද මෙම පරීක්ෂණයන්ගෙන් සාර්ථකව සමත්වන්නන් ගුවන් හමුදවට බඳවා ගැනීමට ප්‍රථම පවත්වනු ලබන හුරුකරවීමේ පුහුණු සැසිවාර සඳහා සහභාගි විය යුතුවේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම ශාඛාවන්ට අවශ්‍ය වන්නාවූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හිදී සහ සම්මුඛ පරීක්ෂණයන්හිදී දක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක නිලධාරින්, නිලධාරි නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිලධාරින්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිලධාරි නිවස්නයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක නිලධාරින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අයකරනු ලැබේ.

(ඕ) සියලුම නිලධාරින් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියලුම නිලධාරින් ගුවන් හමුද පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

11. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

12. *වැටුප් හා දීමනා* :

*අ.* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනික නිලධාරින්ගේ සහ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් ක්‍රමය පහත සඳහන් පරිදි වේ. :-

| *වර්ෂය* / *නිළය* | *2020 (වසරකට)* |
|---|---|
| ඔෆිසර් කැඩෙට් | 3,88,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය භට) | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය භට නොවන) | 5,02,860.00 |
| ප්ලයින් ඔෆිසර් | 5,71,380.00-(30**x**16020) =1,051,980.00 |
| ප්ලයිට් ලෙප්ටිනන් | 6,67,500.00-(24**x**16020) =1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 7,31,580.00-(22**x**16020) =1,084,020.00 |
| විංග් කමාණ්ඩර් | 7,51,140.00-(17**x**19560) =1,083,660.00 |

*ආ. අනෙකුත් දීමනා* :

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනාව වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ.

(6) අතුරු දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ. (2019 වසරේ අයවැය යෝජනාවට අනුව අතුරු දීමනාව මසකට රු. 2,500.00 බැගින් වෙනස් වී ඇත.)

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා දිනකට රු. 774.37ක් ගෙවනු ලැබේ).

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු. 637.50ක් ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට පහත සඳහන් පරිදි ගෙවල් කුලී දීමනාවන් හිමි වේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඉන් ඉහළ නිලයන්ට මසකට රු. 3,200.00 සිට රු. 8,500 දක්වා වේ.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිලය සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500.00 සිට රු. 5,000.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට, කලත්‍රයාට සහ ළමයින්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යෑමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට) සපයනු ලැබේ.

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්හට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට ගමන් කිරීම සඳහා නොමිලේ ගමන් කිරීම සඳහා බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ගෙවනු ලැබේ.

(19) ඉංජිනේරු දීමනාව මසකට රු. 15,000.00ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරින් හට පමණයි)

13. *විශ්‍රාම වැටුප් /පාරිතෝෂික දීමනා.*—වරින් වර සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. සියලුම නිලධාරින් වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව වේ.

14. *අයදුම්කරුවන්ට උපදෙස්* :

(*අ*) පහත දක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2020 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට ප්‍රථම ලැබෙන සේ ''විධායක, ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''ආධුනික ශිෂ්‍යභට නිලධාරි/ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත............ ශාඛාව'' යනුවෙන් සටහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් ශාඛාවකට පමණක් ඉල්ලුම්කළ යුතු අතර ශාඛාවන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය. :

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක් (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ.),

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්,

(3) අයදුම්කර ඇති ශාඛාවට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතුය),

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත හා ඡායා පිටපත බැගින්,

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්,

(7) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්,

(8) අඟල් 2 x 2 1/2 ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූපදෙකක්.

(*ඈ*) නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(*ඉ*) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(*ඊ*) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

15. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

16. *තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය* :

(*අ*) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ලිඛිතව දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඈ*) තෝරාගැනීමේ පරීක්ෂණයන් අතරතුර සියලු අයදුම්කරුවන්හට ලිඛිත, ප්‍රායෝගික හා නිලධාරි තත්ව පරීක්ෂණයන් සඳහා පෙනී සිටීමට සිදුවේ.

(*ඉ*) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(*ඊ*) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේ ය.

(*උ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,<br>
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),<br>
වීඑස්වී, යූඑස්පී, එම්එස්සී<br>
(ආරක්‍ෂක හා උපාය අධ්‍යයන),<br>
එන්ඩීසී,පීඑස්සී,<br>
එයාර් මාර්ෂල්,<br>
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති,<br>
මූලස්ථානය,<br>
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,<br>
තැ. පෙ. 594,<br>
කොළඹ.

| *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදාවේ . . . . . . . . . . ශාඛාව**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. තැපැල් ලිපිනය :————.

6. උපන් දිනය :————.
වයස ඃ (2020 ජූලි මස 15 වන දිනට) අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : සෙන්ටිමීටර් :————. (අඩි :————. අඟල් :————.)

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

9. දිස්ත්‍රික්කය :————.

10. ඡන්ද කොට්ඨාසය :————.

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

12. දුරකථන අංකය :————.

13. විවාහක හෝ අවිවාහක බව :————.

14. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

15. අධ්‍යාපනය ලැබූ පාසල :————.

16. පාසල් පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | *වෙනත් සුදුසුකම්* | | | |

17. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

18. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

19. මව්පියන් පිළිබඳ විස්තර :-

| මවගේ සහ පියාගේ සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දැනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| | | | | |
| | | | | |

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීන් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

27. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

28. ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ..................... නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(ආ) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අධිකාරියක් ලැබීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

—————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :—————.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

—————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

—————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

* අදාළ නොවන වචන කපා හරින්න.

02-702

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව — නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය හා ස්වේච්ඡා නිලධාරීන් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට සුදුසු පිරිමි/කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව
(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව
(ඇ) සැපයුම් ශාඛාව
(ඈ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
(ඉ) වෛද්‍ය ශාඛාව
(ඊ) දන්ත වෛද්‍ය ශාඛාව
(උ) පරිපාලන නීති ශාඛාව
(ඌ) පරිපාලන පශු වෛද්‍ය ශාඛාව
(එ) පරිපාලන අධ්‍යාපන ශාඛාව
(ඒ) පරිපාලන තූර්යවාදක ශාඛාව
(ඔ) පරිපාලන විගණන ශාඛාව
(ඕ) තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

*මූලික අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද, සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා සිටීම අනිවාර්ය වේ. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර).

(ආ) අ. පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(ඇ) ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගත් (Pearson/Edexcel-International Ordinary /Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමග සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සළකා බලනු ලැබේ.

*වෘත්තීය/ශාස්ත්‍රීය සුදුසුකම් :*

(අ) කාර්මික ඉංජිනේරු ශාඛාව :

(1) කාර්මික ඉංජිනේරු නිලධාරී (පර්යේෂණ නිලධාරී) - පිරිමි (ස්වේච්ඡා)
ගුවන්යානා ඉංජිනේරු, විද්‍යුත්, විදුලි හා ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය ලබා තිබීම.

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵලවලින් ඉහල ශ්‍රේණිගත අගයක් ලබා තිබීම.

දේශීය විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. අවසන් වසරේ නවීන ආකාරයේ ව්‍යාපෘතියක් නිමවා තිබීම සහ අදාල කේෂ්ත්‍රය පිළිබඳ පුහුණුවක් ලබා ඇති අයවළුන්ට ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබේ.

(ආ) විද්‍යුත් ඉංජිනේරු ශාඛාව :

(1) **විද්‍යුත් ඉංජිනේරු නිලධාරී - පිරිමි (නිත්‍ය)**
විද්‍යුත් හා විදුලි සංනිවේදන විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ විද්‍යුත්/විදුලි සන්නිවේදනය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුලත් වූ භෞතිකවිද්‍යාවේදී උපාධියක් හෝ මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු ශිල්පය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (එච්. එන්. ඩී. ඊ.) හෝ තාක්ෂණ ඉංජිනේරු ආයතනය මගින් පිරිනමන ලද විද්‍යුත්/විදුලි සංනිවේදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්) ලබා තිබීම. IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) සැපයුම් ශාඛාව :

(1) **භෝජනාගාර කළමණාකරු - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

හෝටල් කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ හෝටල් කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ දේශීය/විදේශීය පිළිගත් ආයතනයක හදාරන ලද කාණ්ඩ 4කින් සමන්විත පූර්ණකාලීන ආගන්තුක සත්කාර පිළිබඳ මූලික, මධ්‍යම සහ උසස් පාඨමාලාවක් හදාරා තිබීම හා තරු පංති හෝටලයක ආහාරපාන අංශයේ භෝජනාගාර හා ආහාර කළමණාකරණය පිළිබඳව ඉහත සුදුසුකම්වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක (2) පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

(2) ඇඟළුම් තාක්ෂණික නිළධාරී - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

තාක්ෂණික හෝ ඉංජිනේරු විද්‍යාව සඳහා වූ විද්‍යාවේදී උපාධිය ලබා තිබීම, ඇඟළුම් සහ රෙදිපිළි තාක්ෂණය සඳහා වූ පශ්චාත් උපාධිය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඇඟළුම් ආයතනයෙන් හෝ පිළිගත් ඇඟළුම් ආයතනයකින් රෙදිපිළි හා ඇඟළුම් සම්බන්ධව ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ඈ) ගුවන් තොටුපළ නිර්මාණ ශාඛාව
(1) සිවිල්/විදුලි ඉංජිනේරුවන් - පිරිමි (නිත්‍ය)
සිවිල්/විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂිත වූ විද්‍යාවේදී උපාධිය සහ IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ සිවිල්/විදුලි ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (එන්.ඩී.ටී)/ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්)/උසස් ජාතික ඩිප්ලෝමාව (එච්.එන්.ඩී.ඊ) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම. (ජාතික ඩිප්ලෝමාධාරීන් හට IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ).

(ඉ) වෛද්‍ය ශාඛාව :

(1) **කායික රෝග විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් කායික රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD Medicine) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, කායික රෝග විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) **ශල්‍ය වෛද්‍ය විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ශල්‍ය වෛද්‍ය විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -General Surgery) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ශල්‍ය වෛද්‍ය විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(3) **නිර්වින්දන විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් නිර්වින්දන විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -Anesthesiology) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, නිර්වින්දන විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(4) **ළමා රෝග විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ළමා රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD -Pediatric) පිළිබඳ

වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ළමා රෝග විශේෂඥවරයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(5) **ප්‍රසව හා නාරිවේද විශේෂඥ - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)**
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය විද්‍යාව (Ms-Gynecology and Obstetrician) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර, ප්‍රසව හා නාරිවේද විශේෂඥවරයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

***විශේෂ සටහන්***.-විශේෂඥ වෛද්‍යවරුන් සඳහා 2020 ජූලි මස 15 වැනි දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි. නමුත් වයස අවුරුදු 40ට වැඩි විශේෂඥ වෛද්‍යවරුන්, විශේෂ නිපුණතාවයක්/දක්ෂතාවයක් හා පළපුරුද්දක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි (විංග් කමාණ්ඩර් නිළය සඳහා) ඔහු/ඇය බඳවා ගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(ඊ) ***දන්ත වෛද්‍ය ශාඛාව*** :

(1) **දන්ත වෛද්‍ය නිලධාරි - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**
දන්ත වෛද්‍ය (බී. ඩී. එස්.) උපාධිය හෝ ඒ හා සමාන පිළිගත් විදේශ දන්ත වෛද්‍ය උපාධියක් තිබීම සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචි වී තිබිය යුතුය.

(2) **පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි/කාන්තා (නිත්‍ය)**

දන්ත වෛද්‍ය සිසුන් බී. ඩී. එස්. (BDS) (ශ්‍රී ලංකා) විශ්ව විද්‍යාල වර්ෂාර්ධය (semester) අටක් (8) සම්පූර්ණ කර තිබීම හෝ විදේශ දන්ත වෛද්‍ය විද්‍යාලයකින් සමත් වූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත හැකි බී. ඩී. එස්. (BDS) (ශ්‍රී ලංකා) උපාධියට සමාන වෛද්‍ය උපාධියක් අනිවාර්යයෙන් ම ලබා තිබිය යුතුය. තව ද වෛද්‍ය සභාවේ ස්ථිර හෝ තාවකාලික ලියාපදිංචිය හිමි හෝ අහිමි සුදුසුකම් ඇති තෝරාගත් අයදුම්කරුවන් අධිකාරිලත් නිලධාරීන් ලෙස බඳවාගනු ලබන අතර බඳවාගත් දින සිට අවුරුදු පහක් (5) ඇතුළත ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිර ලියාපදිංචිය ලබා ගත යුතුය.

(උ) ***පරිපාලන නීති ශාඛාව*** :

(1) **නීති නිලධාරී - පිරිමි/කාන්තා (නිත්‍ය)**

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකුවීම. නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (3) කාලයක් මහේස්ත්‍රාත් අධිකරණයේ, දිසා අධිකරණයේ මහාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තුළ නඩු කටයුතු මෙහෙයවා තිබීම, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් වාණිජ ගිවිසුම් සැකසීම පිළිබඳ පළපුරුද්ද, නොතාරිස් කටයුතු පිළිබඳ ලේඛණ සැකසීම, අවබෝධතා ගිවිසුම් සහ මිලදී ගැනීමේ ලේඛණ සැකසීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාව සහ පරිඝණක යතුරු ලිවීම අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

(ඌ) ***පරිපාලන පශු වෛද්‍ය ශාඛාව***

(1) පශු වෛද්‍ය නිලධාරි - පිරිමි (නිත්‍ය)
පශු වෛද්‍ය සහ සත්ව විද්‍යාව පිළිබඳ උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම් තිබීම සහ ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභා මණ්ඩලයේ ලියාපදිංචි වී තිබීම.

(එ) **පරිපාලන අධ්‍යාපන ශාඛාව :**

(1) **ඉංග්‍රීසි භාෂා උපදේශක - පිරිමි /කාන්තා (නිත්‍ය/ ස්වේච්ඡා)**

පිළිගත් විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය සමඟ ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම හෝ ශාස්ත්‍රවේදී උපාධිය/විද්‍යාවේදී උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම හෝ අධ්‍යාපනවේදී ඩිප්ලෝමාවක් හදරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය සමග ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදරා තිබීම හෝ ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා තිබීම. පිළිගත් ආයතනයක අවම වශයෙන් වසරක ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස සේවා පළපුරුද්දක් තිබීම හෝ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි ගුරු අභ්‍යාස පාඨමාලාවක් (මාස 06කට නොඅඩු) හදරා තිබිය යුතුයි;

*හෝ*

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක වසර තුනක (3) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව සාර්ථක ලෙස හැදෑරීම හෝ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු අභ්‍යාස විද්‍යාලයක වසර දෙකක (2) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස හැදෑරීම හෝ රජයේ හෝ රජය විසින් පිළිගත් විදේශ ආයතනයක වසර තුනක (3) ගුරු අභ්‍යාස පුහුණුවක් සාර්ථකව නිම කර තිබීම.

(2) **ප්‍රංශ සහ චීන භාෂා උපදේශකයන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

ප්‍රංශ/චීන භාෂාව පිළිබඳ වසරක (1) ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණකර තිබීම සහ රජයේ හෝ රජය විසින් පිළිගත් ආයතනයක වසර තුනක (3) ප්‍රංශ/චීන භාෂා ගුරුවරයෙකු ලෙස සේවා පළපුරුද්දක් තිබීම.

(ඒ) **පරිපාලන තූර්ය වාදක ශාඛාව**

(1) තූර්ය වාදක පාලක - බටහිර සංගීත (මිලිටරි තූර්යවාදක කණ්ඩායම) - පිරිමි (නිත්‍ය)

බටහිර සංගීතය පිළිබඳ උපාධියක් හෝ ඩිප්ලෝමාවක් හෝ බටහිර සංගීතය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ රාජකීය සංගීත පාසල, ට්‍රිනිටි විද්‍යාලය ලන්ඩන්, ලන්ඩන් සංගීත විද්‍යාලයේ හෝ වෙනත් ජාත්‍යන්තරව පිළිගත් සංගීත පාසලක 5 වන හෝ ඉහල ශ්‍රේණියේ න්‍යායික හෝ ප්‍රායෝගික විභාගයක් සමත් වී තිබීම.

(ඹ) **පරිපාලන විගණන ශාඛාව**

(1) අභ්‍යන්තර විගණන නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී/කළමණාකරණ/ගණකාධිකරණ හෝ ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රයේ උපාධියක් සමග පහත සඳහන් වෘත්තිය සුදුසුකම් වලින් එකක් හෝ වැඩි ගණනක් සපුරා තිබීම.

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරි (CBA) සහතිකය හෝ එයට සමාන එක්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) හෝ ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (CMA) සුදුසුකම් සපුරා තිබීම හෝ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරි සංගමයේ (APFA) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

(ඹ) **තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව :**

(1) **ජාල කළමණාකාර නිලධාරීන් - පිරිමි /කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග දත්ත ජාලකරණය හෝ ජාලකරණ පද්ධතිය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(2) **මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)**

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිගණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්.ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග C#,ASP. Net 4.0 and above, WCF,MVC 5, Entity Framework, LINQ, Angular, Visual Studio 2015, Team Foundation Server (TFS), NET Core, Python, Big data analysis tools or MS SQL පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(3) තොරතුරු/වෙබ් අවකාශ ආරක්ෂක විශේෂඥයින් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

පරිගණක ආශ්‍රිත විෂය ධාරාවෙන් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් හෝ පරිඝණක ආශ්‍රිත විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හෝ පරිඝණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී.ඊ.එස්) හෝ ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම සමග තොරතුරු/වෙබ් අවකාශ සුරක්ෂිතතාවය පිළිබඳව හසල දැනුමක් සහ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(4) වෙබ් අඩවි නිර්මාණකරුවන් - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)

පරිගණක ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක්/තොරතුරු තාක්‍ෂණ විද්‍යාවේදී උපාධියක්/පරිගණක විද්‍යාවේදී උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂයක් ලෙස ඇතුළත් වූ විද්‍යාවේදී උපාධියක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ පරිගණක ඉංජිනේරු විද්‍යාවේ ජාතික ඩිප්ලෝමාව (එන්. ඩී. ඊ. එස්.) ඒ හා සමාන පාඨමාලාවක් සම්පූර්ණකර තිබීම සමග වෙබ් අඩවි නිර්මාණකරුවන් සඳහා වෙබ් අඩවි නිර්මාණය පිළිබඳව වගකීමක් සහිත හසල දැනුමක් සහ HTML/XHTML/HTML 5, CSS (Cascade Style Sheet) JavaScript, JQuery, flash action script, PHP, MySQL, ASP.NET,MSSQL පිළිබඳව මනා දැනුමක් තිබීම ආදිය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. *පළපුරුද්ද*.-ඉහත සුදුසුකම්වලින් පසුව අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (2) හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම තෝරාගැනීමේදී අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

4. *අනෙකුත් සුදුසුකම් :*

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (ආ) | සිවිල් තත්ත්වය | : | විවාහක/අවිවාහක |
| (ඇ) | ස්ත්‍රී පුරුෂ භාවය | : | පිරිමි/කාන්තා (අදාළ පරිදි) |
| (ඈ) | වයස | : | 2020 ජූලි මස 15 වැනි දිනට අවුරුදු 18 සිට 33 දක්වා |
| (ඉ) | උස | : | **පිරිමි** - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6) ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>වෛද්‍ය/දන්ත ශාඛාව - සෙන්ටිමීටර් 165.0<br>(අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය.<br><br>**කාන්තා** - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුයි.<br>වෛද්‍ය/දන්ත ශාඛාව - සෙන්ටිමීටර් 160.0<br>(අඩි 5 යි අඟල් 3) ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| (ඊ) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 |

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^{2}}$$

| | | | |
|---|---|---|---|
| (උ) | පපුව | : | අඟල් 32" ට නොඅඩු විය යුතුයි. (පිරිමි) |
| (ඌ) | වර්ණ දෘෂ්ටිය | : | සීපී 2 |
| (එ) | දෘෂ්ටි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිතව)<br>(වෛද්‍ය හා දන්ත වෛද්‍ය ශාඛාවල අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ටි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක් නම්, එය උපැස් සහිතව 6/6 තත්ත්වයට තිබීම අනිවාර්ය වේ.) |

5. ***විශේෂ සටහන් :***

(1) ඉහත සඳහන් 2, 3 සහ 4 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

(2) තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි, ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්/ෆ්ලයින් ඔෆිසර්/ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිලයන්හි අධිකාරියට පත්කරනු ලැබේ.

(3) තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින්හට ලිඛිත, ප්‍රායෝගික පරීක්ෂණයකට සහ නිළධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා පෙනී සිටීමට සිදුවේ.

(4) තෝරාගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

(5) සියලුම උපාධින් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කළ යුතුය.

(6) යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක්/දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(7) ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(8) *රාජ්‍ය භාෂා අවශ්‍යතා.*-තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

(9) තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය

කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙන යම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

(10) 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව පයිලට් ඔෆිසර් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව ''සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක'' කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප/ගිවිසුම් බැඳී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

(11) ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

(12) විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

(13) අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(14) විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 6.ඉ.(11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

06. *වැටුප් හා දීමනා* :

*අ.* ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ. :-

| *වසර* / *නිලය* | *2020 (වාර්ෂිකව)* |
|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | 4,63,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | 5,02,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 5,71,380.00- (30 x 16,020) = 10,51,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 6,67,500.00-(24 x 16,020) = 10,51,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 7,31,580.00-(22 x 16,020) = 10,84,020.00 |
| විංග් කමාන්ඩර් | 7,51,140.00-(17 x 19,560) = 10,83,660.00 |

*ආ.* වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

| *වසර* / *ශ්‍රේණිය* | *2020 (වාර්ෂිකව)* |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 6,51,480.00 (2 x 16,020-7 x 16,140 - 2 x 19,560-16X26,040) = 12,52,260.00 |
| 2 වන ශ්‍රේණිය | 6,99,660.00 (6 x 16,140-2 x 19,560-16 x 26,040) = 12,52,260.00 |
| 1 වන ශ්‍රේණිය | 8,61,660.00 (15X26,040) =12,52,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 10,56,000.00 (12 x 32,400) =14,44,800.00 |

ඇ. දන්ත වෛද්‍ය නිලධාරින්ගේ වැටුප් :

| වසර / ශ්‍රේණිය | 2020 (වාර්ෂිකව) |
|---|---|
| 2 වන ශ්‍රේණිය | 6,35,460.00 (3 x 16,020-7 x 16,140 - 2 x 19,560-16x26,040) = 12,52,260.00 |
| 1 වන ශ්‍රේණිය | 8,61,660.00 (15x26,040) =12,52,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 10,56,000.00 (12 x 32,400) = 14,44,800.00 |

ඈ. අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරින් සඳහා :

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 3,400.00 (මසකට) |

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 2,125.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,700.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 400.00 (මසකට) |

(3) විවේක කාල රාජකාරි බටා
ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 35,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරි දීමනාව

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 687.00 (පැයකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 796.00 (පැයකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 1,101.00 (පැයකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 1,302.00 (පැයකට) |

(5) භාෂා ප්‍රවීණතා දීමනාව

| | |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | - රු. 1,485.00 (මසකට) |
| 2 වන ශ්‍රේණිය | - රු. 1,495.00 (මසකට) |
| 1 වන ශ්‍රේණිය | - රු. 2,320.00 (මසකට) |
| විශේෂ ශ්‍රේණිය | - රු. 2,850.00 (මසකට) |

(6) ඉ (18) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඉ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00ක් ගෙවනු ලැබේ.

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ.

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ක් ගෙවනු ලැබේ. (2019 වසරේ අයවැය යෝජනාවට අනුව අතුරු දීමනාව මසකට රු. 2,500.00 බැගින් වෙනස් වී ඇත.)

(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 774.37 පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)

(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා

(12) දුරකතන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිලය සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500 සිට රු. 5,000 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/ බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිළ ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදළ පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිළධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරින් හා දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(19) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය නිලධාරින් හා දන්ත වෛද්‍ය නිලධාරින් සඳහා පමණයි.)

(20) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය නිලධාරීන් හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි.)

(21) අමතර රාජකාරි ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය නිලධාරීන් හා දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(22) දුරකතන බිල් දීමනාව

| | |
|---|---|
| විශේෂඥ වෛද්‍ය නිලධාරි | - රු. 8,000.00 (මසකට) |
| වෛද්‍ය නිලධාරි | - රු. 4,000.00 (මසකට) |

7. ***විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.***—විටින් විට සංශෝධනය කරනු ලැබූ හා 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුව ය.

8. ***ඉල්ලුම්කරුවන්ට උපදෙස්*** :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් 2020 මාර්තු මස 20 වැනි දින මධ්‍යාහ්න 12.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ ''………… ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සළකා බලනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග සහතික කරන ලද ඡායාපිටපත් ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය හා එහි ඡායා පිටපතක් (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත්කළ සහතිකය වලංගු නොවේ.)

(2) ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපතක්.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්වල මුල් පිටපත් හා එහි ඡායාපිටපත බැගින්

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල් පිටපත හා ඡායා පිටපත බැගින්

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දනට සේවා යෝජකයාගෙන් (දනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත හා ඡායාපිටපත බැගින්.

(7) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(8) අඟල් 2 x 2 1/2 ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූප දෙකක්

(අ) නියම කරන ලද අවස්ථාවන් හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සළකා බලනු නොලැබේ.

(ආ) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඇ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

9. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙලිදරව් වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අහිමි වීමට ද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

10. *තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය* :

(අ) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදුවන්නේ ය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(ඇ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(ඉ) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම, එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

(ඊ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (ආරක්ෂක හා උපාය අධ්‍යයන), එන්ඩීසී, පීඑස්සී
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594
කොළඹ.

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ............ ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ඉල්ලුම් කරන ශාඛාව :————.

5. ඉල්ලුම් කරන තනතුර :————.

6. ස්ථිර ලිපිනය :—————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

8. තැපැල් ලිපිනය :—————.

9. විද්‍යුත් ලිපිනය :—————.

10. උපන් දිනය :—————.
වයස ; (2020 ජූලි මස 15 දිනට) අවුරුදු :—————., මාස :—————., දින :—————.

11. උස : සෙන්ටිමීටර් . . . . . . . . . . (අඩි :———— අඟල් :————.)

12. දිස්ත්‍රික්කය :—————.

13. ඡන්ද කොට්ඨාසය :—————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය :—————.

15. දුරකථන අංක :—————.

16. විවාහක හෝ අවිවාහක බව :—————.

17. අධ්‍යාපනය ලැබූ පාසල :—————.

18. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | **විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම්** | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :—————.

20. පාසලෙන් /විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර ඃ

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | දැනට ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා ඃ | | | | |
| මව ඃ | | | | |

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

25. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

29. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

02-703

## ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාව

### ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී.

*මූලික අධ්‍යාපන සුදුසුකම් :-*

2. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

*වෘත්තිය සහ අදාළ අධ්‍යාපන සුදුසුකම් :*

3. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් වේ :-

*අ.* ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) :

(1) ගුවන්යානා සැකිලි ශිල්පී (Aircraft Structural Technician)
(2) ගුවන්යානා යන්ත්‍ර ශිල්පී (Aircraft Engine Technician)
(3) ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී (Aircraft Electrical and Instrument Technician)
(4) ගුවන්යානා ආරක්ෂක උපකරණ ශිල්පී (Aircraft Safety Equipment Technician)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සමත්ව ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ;

සහ

තව ද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු පාඨමාලාවන් සමත් සහතිකයක් තිබෙන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

*ආ. සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) :*

(1) අවි ආයුධ ශිල්පී
(2) රථවාහන කාර්මික ශිල්පී
(3) මතුපිට කාර්මික ශිල්පී
(4) ලෝහ තහඩු කාර්මික ශිල්පී
(5) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී
(6) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී
(7) ගුවන්යානා ගිනියම් පෑස්සුම් ශිල්පී
(8) ගුවන් ඡායාරූප ශිල්පී
(9) ලියවන පට්ටල් ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(10) රථ වාහන ක්‍රියාකරු (පිරිමි) :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. රියැදුරු බලපත්‍රය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

*(ඇ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන්* (පිරිමි)

(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සංනිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(3) දුරකථන ක්‍රියාකරු
(4) ගුවන් විදුලි සංනිවේදක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

*(ඈ)* වෛද්‍ය වෘත්තීන් :

(1) හෙද සහයක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ.) විභාගයෙන් විද්‍යා/ගණිත විෂය ධාරාවෙන් පහත දක්වෙන ආකාරයෙන් සාමාර්ථයන් ලබා තිබීම එහි ඉදිරියෙන් දක්වා ඇති වෘත්තීන්ට (හෙද සහයක වෘත්තිය යටතේ) අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

| | |
|---|---|
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ) **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යා** යන විෂයයන්ගෙන් 3ක් හදරා සියලුම විෂයයන් එක් වරකදී සමත්ව තිබීම. | - හෙද ඩිප්ලෝමාව (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ) **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය / භෞතික විද්‍යාව** යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් හා **රසායන විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | - ඖෂධවේදී (පිරිමි/කාන්තා)<br>- රසායනාගාර කාර්මික ශිල්පී (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ. පෙළ.) **රසායන විද්‍යාව/භෞතික විද්‍යාව** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, **ජීව විද්‍යාව** සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | - විද්‍යුත් කන්තුක රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා)<br>- විද්‍යුත් නිකරපණ රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා. පෙළ) **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) **රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද, **ජීව විද්‍යාව**, භෞතික විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරකදී සමත්ව තිබීම. | -විකිරණ ශිල්පී (පිරිමි/කාන්තා)<br>-අක්ෂි තාක්ෂණවේදී (පිරිමි/කාන්තා) |
| අ. පො. ස. (සා.පෙළ) **ඉංග්‍රීසි** විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) **රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව** යන විෂයයන් අතුරින් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද **ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය** සඳහා සම්මාන සාමාර්ථයක්ද සහිතව එක් වරකදී සමත්ව තිබීම. | - සෞඛ්‍ය පරීක්ෂක (පිරිමි) |

*(ඉ) දන්ත සහයක (පිරිමි/කාන්තා)* :

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යා විෂය ධාරාව/ භෞතික විද්‍යා විෂය ධාරාව සහ තාක්‍ෂණවේදය විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනක් එක් වරකදී සමත්ව තිබීම සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තීය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) *පරිපාලන වෘත්තීන් :*

(1) පරිපාලන සහයක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ,ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) *මෙහෙයුම් වෘත්තීන් :*

(1) මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක) (පිරිමි) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(2) *ගිනි නිවන්නා (පිරිමි) :*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. සැහැල්ලු වාහන රියැදුරු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) *මෙහෙයුම් භූමි (පිරිමි/කාන්තා) :*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(ඌ) *සැපයුම් වෘත්තීන් :*

(1) සැපයුම් සහායක (පිරිමි/කාන්තා)
(2) ගුවන් යානා ඉන්ධන සැපයුම්කරු (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) *සලාක සහයක (පිරිමි) :*
සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය.

(4) *භෝජනාගාර සහයක (පිරිමි/කාන්තා) :*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(5) ගුවන් යානා කාර්ය මණ්ඩල සහයක (පිරිමි/කාන්තා) :

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව කථාකිරීමේ හැකියාවක් තිබීම සහ ප්‍රියමනාප පෙනුමකින් යුක්ත වීම අනිවාර්යවන අතර, ගුවන් සේවකයකු/ගුවන් සේවිකාවක ලෙස පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. (ඇඟිලි තුඩුවලින් සිට ගත් විට සෙන්ටි මීටර් 212 ක උසක් දක්වා තම දෑත් යොමු කළ හැකි විය යුතුය.)

(6) *නිල ඇඳුම් පරිස්කාරක (පිරිමි/කාන්තා)*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අධිවේගී මහන මැෂින් ක්‍රියා කරවීමේ හැකියාව (Over Lock, Button Hole, Button Attche, Double Needle, Bar Tack ) ද පතුරම් රහිතව මිමි අනුව මෝස්තර නිර්මාණය කිරීමේ හැකියාව, ඇඳුම් කැපීම සහ මහන මැෂින් පිළිබඳ කාර්මික දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(එ) *පොලිස් (පිරිමි/කාන්තා) :*
සිංහල/දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8 ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6 ට නොඅඩු කාන්තා අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

(ඒ) *ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි) :*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ක්‍රීඩාවලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන් තෝරා ගැනීමේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ගුවන් භටයන්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව ඉදුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී.

4. *වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන වෘත්තීය සුදුසුකම්* :

(අ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) :

(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

*සහ*

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික සහතිකය (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්) හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණ කාලීන දෑ අවුරුදු (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්) පාඨමාලා සහතිකයක් තිබිය යුතුය. ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) සහතිකය තිබීම අමතර සුදුසුකමක් සේ සැලකේ.

(ආ) *සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)*

(1) රථවාහන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

*සහ*

මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් සඳහා වසරක පූර්ණ කාලීන පාඨමාලාවක් හෝ දෙවසරක් හෝ ඊට වඩා වැඩි අර්ධ කාලීන පාඨමාලාවක් රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක හදරා ඒ පිළිබඳව පිළිගත් ආයතනයක දෙවසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද හෝ මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් සඳහා හය මාසික පූර්ණ කාලීන පාඨමාලාවක් හෝ වසරක් හෝ ඊට වඩා වැඩි අර්ධ කාලීන පාඨමාලාවක් රාජ්‍ය හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක හදරා ඒ පිළිබඳව පිළිගත් ආයතනයක තෙවසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද හෝ NVQ level III හෝ ඊට ඉහල සහතිකයක් මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී යන එක් පාඨමාලාවක් සඳහා රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ඒ පිළිබඳව පිළිගත් ආයතනයක වසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්දක් ලබා තිබීම.

(2) *මතුපිට කාර්මික ශිල්පී (රසායනාගාර කාර්මික ශිල්පී)* (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය, විද්‍යාව යන විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තව ද අ. පො. ස. (උ.පෙළ) විභාගය රසායන විද්‍යාව සාමාන්‍ය සාමර්ථයක් ලබා තිබීම හෝ භෞතික විද්‍යාව/ජීව විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අ.පො.ස. උ. පෙළ හදරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

විද්‍යුත් ලෝහ ආලේපනය පිළිබඳ මාස 6ක පූර්ණ කාලීන පාඨමාලාවක් හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක වසරක අර්ධ කාලීන පාඨමාලාවක් හදරා තිබීම සහ පිළිගත් ආයතනයක වසරක පළපුරුද්ද හෝ අදළ ක්ෂේත්‍රයක NVQ level II සහතිකය සමග සේවා පළපුරුද්දක් තිබීම. ඉහත මූලික හා උසස් අධ්‍යාපන සුදුසුකම් සමග ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හෝ කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ (IDB) හෝ වෙනත් ඕනෑම පිළිගත් ආයතනයක පුහුණුවක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) **පරිගණක කාර්මික ශිල්පී (පිරිමි)** :

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

පරිගණක පුහුණුව පිළිබඳ මාස 06 ක පූර්ණ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාලකරණය/මෘදුකාංග නිර්මාණය/දෘඩාංග සහ මෘදුකාංග නවීකරණය යන විෂයයන් පිළිබඳව අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම; හෝ පරිගණක පුහුණුව පිළිබඳ මාස 12 ක අර්ධ කාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ ජාලකරණය/මෘදුකාංග නිර්මාණය/දෘඩාංග හා මෘදුකාංග නවීකරණය යන විෂයයන් පිළිබඳ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 පළපුරුද්දක් ලබා තිබීම.

5. *අනෙකුත් සුදුසුකම්* :

අ. ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය/ස්වෙච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි :

| | | |
|---|---|---|
| (1) පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි; |
| (2) සිවිල් තත්ත්වය | : | නිත්‍ය - අවිවාහක<br>ස්වේච්ඡා හා ඉඳුරාම බඳවා ගැනීම - විවාහක/අවිවාහක |
| (3) වයස | : | 2020 ජූලි මස 15 වැනි දිනට<br>*නිත්‍ය*<br>පිරිමි - අවුරුදු 18ත් 23ත් අතර<br>කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර<br><br>*ස්වෙච්ඡා*<br>පිරිමි - අවුරුදු 18ත් 30ත් අතර<br>කාන්තා - අවුරුදු 18ත් 28ත් අතර<br><br>*ඉඳුරාම බඳවාගැනීම්*<br>පිරිමි- අවුරුදු 18-28ත් අතර<br>කාන්තා - අවුරුදු 18-26ත් අතර |
| (4) උස | : | අඩි 5 යි අඟල් 5ට (165cm) නොඅඩු විය යුතුයි; (පිරිමි)<br>අඩි 5 යි අඟල් 3ට (160.2 cm) නොඅඩු විය යුතුයි; (කාන්තා) |
| (5) බර | : | 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)<br>17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)<br>ශරීර ස්කන්ධ දර්ශකය = $\frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$ |
| (6) වර්ණ දෘෂ්ටිය | : | සිපි 2 ($CP_2$) |
| (7) දෘෂ්ටි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත) |
| (8) පපුව | : | අඟල් 32ට නොඅඩු විය යුතු ය. (පිරිමි) |

(9) *සිවිල් තත්ත්වය* :

(*අ*) නිත්‍ය ගුවන් භටයින්/ ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතුයි. (ගුවන් හමුදාවට බැඳී වසර හතරක් (04) ක් ගතවනතුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවන තුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළැඹෙන අවස්ථාවට අනුව විවාහවීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.)

(*ආ*) අවිවාහක වයස අවුරුදු 25ට වැඩි බඳවා ගන්නා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවනතුරු මෙන්ම මූලික වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා වසරක් ගතවනතුරුත් යන මෙම අවස්ථා දෙකෙහි පසුව එළඹෙන අවස්ථාවට අනුව විවාහ වීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු ලැබේ.

(*ඇ*) අවිවාහක ඉඳුරාම සහ ස්වේච්ඡා බඳවා ගන්නා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවනතුරු මෙන්ම මූලික පුහුණු පාඨමාලාව නිමකරන තෙක් විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(*ඈ*) නර්ථන ශිල්පිනී වෘත්තියේ ගුවන් කාන්තාවන් සඳහා මූලික පුහුණු පාඨමාලාව හදාරා වසර පහක (5) කාලයක් ගතවීමෙන් පසුව විවාහ වීමට අවසර දෙනු ලැබේ.

6. දෙවන, තුන්වන, හතරවන සහ පස්වන ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පස්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා ගනු නොලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමිවලට අනුව උස, බර,

පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්‍ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

7. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

8. ***සේවා කොන්දේසි*** :

(*අ*) අපේක්ෂකයින් අනෙකුත් නිළයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති වෘත්තිය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු ඔහු/ඇය වෘත්තියේ ගුවන්භටයෙකු/ගුවන් කාන්තාවක ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

(*ආ*) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

(*ඇ*) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(*ඈ*) සෑම ආධුනිකයෙකුට ම සියලු ම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(*ඉ*) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

(*ඊ*) පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(*උ*) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුදා සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(*ඌ*) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

(*එ*) පළමුවන ඡේදයේ සිට හතරවන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(*ඒ*) අවිවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන්, ගුවන්භට/ගුවන් කාන්තා නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(*ඔ*) විවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(*ඕ*) සියලුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(*ක*) සියලුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

09. ***බඳවා ගැනීමේ කොන්දේසි*** :

(*අ*) *නිත්‍ය ගුවන් භටයින්/නිත්‍ය ගුවන් කාන්තාවන් සඳහා*

(1) තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවක දී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

(*ආ*) ස්වේච්ඡා ගුවන් භටයින්/ස්වේච්ඡා ගුවන් කාන්තාවන් සඳහා

(1) තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට නිලයට/ගුවන්

කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 05ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

10. ***රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් .***— තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

11. *වැටුප් හා දීමනා* :

(*අ*) නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් භටයින්ට අදාළ මූලික වැටුප සහ දීමනා පරිමාණ පහත සඳහන් පරිදි වේ. :

| *නිලය* | *මූලික වැටුප* | *අනෙකුත් දීමනා* | *අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප* |
|---|---|---|---|
| ගුවන්භට | 29,540.00 | 12,150.00 | 41,690.00 |
| නායක ගුවන්භට | 30,440.00 | 12,150.00 | 42,590.00 |
| කෝප්‍රල් | 31,340.00 | 12,150.00 | 43,490.00 |

12. ***ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස්*** :

(*අ*) පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුපතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ ක යුතුයි. ඉල්ලුම්පත් 2020 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ''විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. (ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පතේ ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා ගුවන් හමුදවේ නිත්‍ය/ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත'' යනුවෙන් සඳහන් කළ යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කල යුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තිය පුහුණු පාසල වෙත ලැබුනා වූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ අයදුම්පත් භාරගනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වුවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමග තිබිය යුතුයි.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :—

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ).

(2) ජාතික හැඳුනුම්පත සහ ඡායා පිටපත;

(3) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික;

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;

(5) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් හෝ දනට සේවා යෝජකයාගෙන් (දනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(7) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්

(8) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අඟල් 2 x 2 1/2 වර්ණ ඡායා රූපයක්.

(*ඈ*) නියම කරනු ලැබූ විට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(*ඉ*) ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් කිසිවක් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(*ඊ*) ඉල්ලුම්පත් සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

14. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

15. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුය. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර, වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහළ මට්ටමේ සිටයි.

16. අයදුම්කරුවෙක්/අයදුම්කාරියක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහි ලා බලපෑම් කිරීමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේ ය.

17. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/අපේක්ෂිකාව තෝරාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

18. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

ඩී. එල්. එස්. ඩයස්,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී
(ආරක්ෂක හා උපාය අධ්‍යයන),
එන්ඩීසී, පීඑස්සී
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ............ වෘත්තීය සඳහා ගුවන්භට /ගුවන් කාන්තා අයදුම්පත**

1. පුරවැසිභාවය :————.

(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. තැපැල් ලිපිනය :————.

6. උපන් දිනය :————.
වයස : (2020 ජූලි මස 15 දිනට) අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : සෙන්ටිමීටර් . . . . . . . . . . (අඩි :——— අඟල් :———.)

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

9. දිස්ත්‍රික්කය :————.

10. ඡන්ද කොට්ඨාසය :————.

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————.

12. දුරකථන අංකය :——————.

13. විවාහක හෝ අවිවාහක බව :——————.

14. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

15. අධ්‍යාපනය ලැබූ පාසල :——————.

16. පාසල් පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෙනත් : | | |

17. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර ඃ-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැන් ලිපිනය* |
|---|---|---|---|
| පියා ඃ<br>මව ඃ | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :——————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :——————.

21. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :——————.

24. සිවිල් හෝ යුද අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :——————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :——————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

28. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

(*අ*) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ..................... නැමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වෙච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :.......................................................
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :.......................................................
.......................................................

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :.......................................................
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :.......................................................
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :.......................................................
.......................................................

————,
ඉල්ලුම්කරුගේ/ඉල්ලුම්කාරියගේ
අත්සන.

* අදළ නොවන වචන කපා හරින්න.

02-701

## ශ්‍රී ලංකා පොලීසිය

### සහයකසේවා උප පොලිස් පරීක්ෂක සහ කාන්තා උප පොලිස් පරීක්ෂක (විකිරණ ශිල්පී/ඖෂධවේදී/විද්‍යුත් ඛන්තුක රේඛණ ශිල්පී/භෞතචිකිත්සක/වෛද්‍ය රසායනාගාර කාර්මික) තනතුරු

ශ්‍රී ලංකා පොලීසියේ සහයකසේවා ආධුනික උප පොලිස් පරීක්ෂක සහ ආධුනික කාන්තා උප පොලිස් පරීක්ෂක (විකිරණ ශිල්පී/ඖෂධවේදී/විද්‍යුත් ඛන්තුක රේඛණ ශිල්පී/ භෞතචිකිත්සක/වෛද්‍ය රසායනාගාර කාර්මික) තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/ බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගැනීමේ කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2020.04.28 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,93,480 - 7 x 4,440 - 2 x 5,940 - 25 x 7,920 - රු. 6,34,440.00

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 03/2016 අනුව සිදුකර ඇත.

තව ද, මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත. :-

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 .00 |
| (*ආ*) | රා. ප. ච. 03/2016 ට අනුව මූලික වැටුපට හිමිවිය යුතු 40% දීමනා | රු. 13,116 .00 |
| (*ඇ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 .00 |
| (*ඈ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 .00 |
| (*ඉ*) | අන්තර් දීමනාව | රු. 2,500 .00 |

(*ඊ*) සංයුක්ත දීමනා රු. 12,000.00 (විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා උපරිමය)
රු. 11,200.00 (විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා උපරිමය)

*මෙම දීමනාවලට අමතරව* -

(i) නොමිලේ ගමන් පහසුකම්,

(ii) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(iii) පවුලේ සාමාජිකයන්ට ද නොමිලේ වෛද්‍ය පහසුකම් ලැබීම.

(iv) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(v) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(vi) රාජකාරී සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

(vii) දක්ෂතාවය මත දේශීය හා විදේශීය පාඨමාලා හැදෑරීමේ අවස්ථා හිමිවේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(*අ*) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-30 ත් අතර විය යුතුය. එසේ වුවද සීමිත පදනම මත බඳවා ගැනීමේදී දැනට පොලිස් සේවයේ නියුතු පොලිස් නිලධාරීන්ට/නිලධාරිණියන්ට උපරිම වයස් සීමාව අවුරුදු 35 වේ.

**සහයකසේවා උප පොලිස් පරීක්ෂක (විකිරණ ශිල්පී) හා සහයකසේවා කාන්තා උප පොලිස් පරීක්ෂක (විකිරණ ශිල්පී) තනතුර සඳහා**

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 02ක් ඇතුළුව එකවර විෂයයන් 03ක් සමත්ව තිබීම;

*සහ*

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සමත්ව තිබීම;

*හෝ*

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ දැනට පූර්ණ කාලීන ලියාපදිංචි විකිරණ ශිල්පියෙකු වීම;

*හෝ*

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විකිරණ ශිල්පී උපාධියක්

ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන 01.-* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02 .-* අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.-*වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) වෘත්තීය *සුදුසුකම්* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ විකිරණ ශිල්පී වසර 02 ක පුහුණු පාඨමාලාව හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

හෝ

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් විකිරණ ශිල්පී උපාධියක් ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන .-* **අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන විකිරණ ශිල්පී පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තීය සුදුසුකම් අදල නොවනු ඇත.**

(*ඈ*) පළපුරුද්ද :

- අ.පො.ස. (උසස් පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවා ගෙන විකිරණ ශිල්පි පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තීය පළපුරුදු කාලය අදාල නොවනු ඇත.

**සහයකසේවා උප පොලිස් පරීක්ෂක (ඖෂධවේදී) හා සහයකසේවා කාන්තා උප පොලිස් පරීක්ෂක (ඖෂධවේදී) තනතුර සඳහා**

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂය ඇතුළුව සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් 03ක් එකවර සමත්ව තිබීම;

සහ

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම;

හෝ

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඖෂධවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

හෝ

- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ දැනට පූර්ණ කාලීන ලියාපදිංචි ඖෂධවේදියෙකු ලෙස ක්‍රියාකරන අභ්‍යන්තර හෝ බාහිර පාඨමාලාධාරී ඖෂධවේදියෙකු වීම.

*සටහන 01.-* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාග යෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02 .-* අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.-***වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.**

(*ඇ*) වෘත්තීය *සුදුසුකම්* :

- වෛද්‍ය විද්‍යාලීය සභාව මගින් පවත්වන බාහිර ඖෂධවේදී විභාගය සමත්වීම වෛද්‍ය සභාවේ අභ්‍යන්තර ඖෂධවේදී විභාගය සමත් වී වසරක කාලයක් සීමාවාසික පුහුණුවක් ලබා වෛද්‍ය සභාවේ ඖෂධවේදියෙකු ලෙස ලියාපදිංචි වී තිබීම;

හෝ

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාල ඖෂධවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන .-* **අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන ඖෂධවේදී පුහුණුව සඳහා**

**තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය සුදුසුකම් අදාල නොවනු ඇත.**

(*ඈ*) *පළපුරුද්ද* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන ඖෂධවේදී පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය පළපුරුදු කාලය අදල නොවනු ඇත.

**සහයකසේවා උප පොලිස් පරීක්‍ෂක (විද්‍යුත් බන්තුක රේඛණ ශිල්පී) හා සහයකසේවා කාන්තා උප පොලිස් පරීක්‍ෂක (විද්‍යුත් බන්තුක රේඛණ ශිල්පී) තනතුර සඳහා-**

(*අ*) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුලුව විෂයයන් 03කින් එක් වරකදී සමත්ව තිබීම;

සහ

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව එක් වරකදී විෂයන් 06කින් සමත්ව තිබීම;

හෝ

- විද්‍යුත් බන්තුක රේඛණ ශිල්පී ඩිප්ලෝමා සහතිකය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන 01*.- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* .- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03*.-වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) *වෘත්තීය සුදුසුකම්* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ විද්‍යුත් බන්තුක රේඛණ ශිල්පි වසර 01 ක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නවීකරණය වූ චක්‍රලේඛණ ප්‍රකාර පුහුණු කාලසීමාවක් තුල පුහුණු පාඨමාලාව හදරා ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන විද්‍යුත් බන්තුක රේඛණ ශිල්පි පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය සුදුසුකම් අදල නොවනු ඇත.

(*ඈ*) *පළපුරුද්ද* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන විද්‍යුත් බන්තුක රේඛණ ශිල්පී පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය පළපුරුදු කාලය අදල නොවනු ඇත.

**සහයකසේවා උප පොලිස් පරීක්‍ෂක (භෞතචිකිත්සක) හා සහයකසේවා කාන්තා උප පොලිස් පරීක්‍ෂක (භෞතචිකිත්සක) තනතුර සඳහා**

(*අ*) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය සහ කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් 02ක් ඇතුලුව එකවර විෂයන් 03ක් සමත්ව තිබීම;

සහ

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් 06කින් සමත්ව තිබීම;

හෝ

- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් භෞතචිකිත්සක හා වෘත්තීය චිකිත්සක විද්‍යාල මගින් පවත්වන පූර්ණකාලීන අවුරුදු 02ක පාඨමාලාව හදරා ඉන් සමත්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

හෝ

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතචිකිත්සක උපාධියක් ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන 01.-* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02 .-* අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.-*වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) වෘත්තීය *සුදුසුකම්* :

- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් භෞතචිකිත්සක හා වෘත්තීය චිකිත්සක විද්‍යාල මගින් පවත්වන පූර්ණ කාලීන අවුරුදු 02ක පාඨමාලාව හදාරා ඉන් සමත්ව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

හෝ

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් භෞතචිකිත්සක උපාධියක් ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන භෞතචිකිත්සක පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය සුදුසුකම් අදල නොවනු ඇත.

(*ඈ*) *පළපුරුද්ද* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන භෞතචිකිත්සක පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය පළපුරුදු කාලය අදල නොවනු ඇත.

**සහයකසේවා උප පොලිස් පරීක්ෂක (වෛද්‍ය රසායනාගාර කාර්මික) හා සහයකසේවා කාන්තා උප පොලිස් පරීක්ෂක (වෛද්‍ය රසායනාගාර කාර්මික) තනතුර සඳහා-**

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (උ. පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, හා කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් 03ක් එකවර සමත්ව තිබීම;

සහ

- අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ 04ක් සහිතව එක්වර විෂයන් 06කින් සමත්ව තිබීම.

*සටහන 01.-* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02 .-* අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.-*වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) වෘත්තීය *සුදුසුකම්* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුහුණු පාසල වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පයට අදළ පුහුණු පාඨමාලාව වසර 02ක කාලයක් හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම;

හෝ

- ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වෛද්‍ය රසායනාගාර තාක්‍ෂණවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන වෛද්‍ය රසායනාගාර කාර්මික පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය සුදුසුකම් අදල නොවනු ඇත.

(ඈ) *පළපුරුද්ද* :

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයකින් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* .- අ.පො.ස.(උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) අධ්‍යාපන සුදුසුකම් තුලින් බඳවාගෙන වෛද්‍ය රසායනාගාර කාර්මික පුහුණුව සඳහා තෝරාගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් සඳහා වෘත්තිය පළපුරුදු කාලය අදල නොවනු ඇත.

(ඉ) *ශාරීරික සුදුසුකම්* :

පිරිමි

- උස අඩි 05 අඟල් 06ට නොඅඩු විය යුතුය.
- පපුව අඟල් 32ට නොඅඩු විය යුතුය. (හුස්ම නොඅල්ලා)

කාන්තා

- උස අඩි 05 අඟල් 04ට නොඅඩු විය යුතුය. (පපුව ප්‍රමාණයන් අදළ නොවේ.)

*සටහන* .- විශේෂ සුදුසුකම් සහ ප්‍රවීණතාවයන් සහිත අයදුම්කරුවන්/අයදුම්කාරියන් සම්බන්ධයෙන් පොලිස්පතිගේ අභිමතය පරිදි මෙම උස සීමාවන් හා පපුවට අදළ සීමාවන්ගෙන් අපගමනය විය හැක.

(ඊ) *දෘෂ්ටීය පිළිබඳ අවශ්‍යතාවයන්* .— එක් ඇසක දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය.

(උ) *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරුවන්/අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලිසිය අපේක්ෂිත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) අවිවාහක පිරිමි/කාන්තා අයවලුන් විය යුතුය. (දික්කසාද වුවන් හා වැන්දඹුවන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.) පොලිස් සේවයේ හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරුවලට අදළ සේවයේ දැනටමත් යෙදී සිටින අයට මෙය අදල නොවේ.
(iv) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
(v) කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා. : පච්ච කොටා තිබීම)
(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 4(අ) සිට 4(උ) දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට්පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඌ) *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

5.1 මූලික පරීක්ෂණය :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතුරින් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත සඳහන් 4(අ) සිට 4(උ) දක්වා වූ සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ.

5.2 *ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය* :

පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්/අයදුම්කාරියන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

5.3 මෙම පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

5.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (වෘත්තීය සුදුසුකම්ලත් අපේක්ෂකයින්/පොලිස් උපසේවයේ බඳවා ගැනීම සඳහා)

**සහයක සේවා උප පොලිස් පරීක්ෂක/කාන්තා උප පොලිස් පරීක්ෂක (විකිරණ ශිල්පී හා වෛද්‍ය රසායනාගාර කාර්මික) තනතුර සඳහා.**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී සුදුසුකම් පරීක්ෂා කිරීමද සිදු කෙරේ.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. වෘත්තීය සුදුසුකම්<br>ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් විකිරණ ශිල්පී/වෛද්‍ය රසායනාගාර කාර්මික උපාධිය ලබා තිබීම හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් විකිරණ ශිල්පී/වෛද්‍ය රසායනාගාර කාර්මික ඩිප්ලෝමාව ලබා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම | 40 | අදළ නොවේ |

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 02. සේවා පළපුරුද්ද සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිගත් සෞඛ්‍ය ආයතනයක සේවා පළපුරුද්ද (වසරකට ලකුණු 04) | 20 | අදළ නොවේ. |
| 03. භාෂා දැනුම/පරිගණක හැකියාව/වෙනත් | 10 | |
| 04. ක්‍රීඩා කුසලතා | 10 | |
| 05. නායකත්වය/ප්‍රජා සේවාවන් | 10 | |
| 06. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | 100 | 40% |

**සහයකසේවා උප පොලිස් පරීක්ෂක/කාන්තා උප පොලිස් පරීක්ෂක (ඖෂධවේදී/විද්‍යුත් ඛන්තුක රේඛණ ශිල්පී/භෞත චිකිත්සක) තනතුර සඳහා.**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී සුදුසුකම් පරීක්ෂා කිරීමද සිදු කෙරේ.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. වෘත්තියට අදාළ සේවා පළපුරුද්ද (වසරකට 06 බැගින් උපරිම ලකුණු 30) | 30 | අදළ නොවේ |
| 02. භාෂා දැනුම/පරිගණක හැකියාව/වෙනත් | 25 | |
| 03. ක්‍රීඩා කුසලතා | 10 | |
| 04. නායකත්වය/ප්‍රජා සේවාවන් | 25 | |
| 05. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | 100 | 40% |

5.5 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (වෘත්තිය සුදුසුකම් නොලත් අපේක්ෂකයින් බඳවා ගැනීම සඳහා)

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී සුදුසුකම් පරීක්ෂා කිරීමද සිදු කෙරේ.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. භාෂා දැනුම/පරිගණක හැකියාව/වෙනත් | 30 | අදළ නොවේ. |
| 02. ක්‍රීඩා කුසලතා | 30 | |
| 03. නායකත්වය/ප්‍රජා සේවාවන් | 30 | |
| 04. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 10 | |
| එකතුව | 100 | 40% |

5.6 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරන බලධාරියා :-

පත්කිරීමේ බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද බලධාරියා.

5.7 මූලික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන අතර, එහි දී 40%ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.

5.8 ලිඛිත විභාගය (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරීන් සඳහා අදළ නොවේ.)

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අවබෝධය සහ භාෂා හැකියාව | 100 | 40% |
| 02. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 03. සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදල සාමාන්‍ය දැනුම | 100 | 40% |

5.9 පවත්වන බලධාරියා :-
පත්කිරීමේ බලධාරියා හෝ ඔහු විසින් බලය පවරන ලද බලධාරියා.

5.10 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු සංඛ්‍යාව ලිඛිත විභාගයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව සමග එකතු කොට අයදුම්කරුවන්/අයදුම්කාරියන් ලබා ගන්නා මුලු ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

5.11 අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාවේ

අනුපිළිවෙලහි කුසලතා ලැයිස්තුවක් අනුව බඳවා ගනු ලැබේ.

(6) *පසුබිම් පරීක්‍ෂණය :*

6.1 ඉහත 5.11 ඡේදය පරිදි බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සම්බන්ධයෙන් යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා පසුබිම් පරීක්‍ෂණය පවත්වනු ලබයි.

*සටහන.*-සමීප ඥතීන් සම්බන්ධයෙන් අපරාධ වාර්තා කිසිවක් නොතිබිය යුතුය. සමීප ඥතීන් යනු අයදුම්කරු/අයදුම්කාරියගේ මව, පියා, භාරකරුවන්, සහෝදර සහෝදරින් සහ සහෝදර සහෝදරියන් විවාහක නම් කලත්‍රයන් ද සමීප ඥතීන් ලෙස සලකනු ලැබේ.

6.2 අයදුම්කරුගේ/අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කරගැනීම සඳහා ඔහු/ඇය හා ඔහුගේ/ඇයගේ සමීප ඥතීන්ගේ ද ඔහු/ඇය සමීපව ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය, හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන්/අයදුම්කාරියන් බඳවාගනු නොලැබේ.

6.3 බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු/ඇය බඳවා ගැනීමට නුසුදුසු කමක් වේ. අසත්‍ය තොරතුරු පැවසූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඕනෑම අවස්ථාවක දී සේවයෙන් ඉවත් කරනු ලැබේ.

6.4 කුසලතා ලකුණු ලැයිස්තුව අනුව බඳවා ගැනීම සඳහා බලාපොරොත්තුවන අයදුම්කරුගේ/අයදුම්කාරියගේ පසුබිම් වාර්තා ලැබෙන තෙක් ඔහුව/ඇය වෛද්‍ය පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

07. *වෛද්‍ය පරීක්ෂණය :*

වෛද්‍ය පරීක්ෂණය සඳහා තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. තව ද, මෙහිදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් පොලිස් රෝහලේ රාජකාරි සඳහා සුදුසු බවට ශාරීරික හා මානසික යෝග්‍යතා පරීක්ෂණයට ද භාජනය කරනු ලැබේ. ප්‍රධාන වෛද්‍ය නිලධාරි විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කළ යුතුය. වෛද්‍ය පරීක්ෂණයට භාජනය විය හැක්කේ එක් වරක් පමණි.

08. *පුහුණුව :*

8.1 ඉඳුරාම බඳවා ගැනීම :
පසුබිම් පරීක්ෂණයෙන් සහ වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් පොලිස්පති විසින් නියම කරන ලද දිනයක දී සති 12ක මූලික පොලිස් පුහුණුවක් සඳහා කැඳවනු ලැබේ.

8.2 වෘත්තීය සුදුසුකම් නොලත් අපේක්ෂකයින් සඳහා මූලික පුහුණුවෙන් පසු මෙම වෘත්තිය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවත්වන තුන් අවුරුදු වෘත්තීය පුහුණු පාඨමාලාව සඳහා යොදවනු ලැබේ.

8.3 සෞඛ්‍ය අමාත්‍යාංශයේ තනතුරට අදළ පූර්ණ කාලීන වෘත්තීය පුහුණුව සාර්ථකව අවසන් නොකරන නිලධාරින්/නිලධාරිනියන්ගේ පත්වීම ස්ථිර කිරීම, වෘත්තීය පුහුණුව සාර්ථකව නිම කරන තෙක් අත්හිටුවනු ලැබේ. එසේම පුහුණුව සාර්ථකව නිම නොකරන හෝ අවසන් විභාගයට මුහුණදීමට ලබාදෙන වාර 03ම අසමත් වන නිලධාරීන්/නිලධාරිණියන්ගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

09. *සේවා කොන්දේසි :*

1. සහතිකපත් ලත් හෝ නොලත් ඉඳුරාම බඳවා ගන්නා ආධුනික නිලධාරින්/නිලධාරිණියන් තුන් වසරක පරිවාස/ආධුනික කාලයකටත්, සීමිත පදනම මත බඳවාගන්නා නිලධාරීන් වෘත්තීය පාඨමාලාවෙන් පසු එක් වසරක වැඩ බැලීමේ කාලයකටත් යටත් වූ ඇත. (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරින් සඳහා අදළ නොවේ.) ආධුනික කාලය තුළ විවාහ වන්නේ නම්, පොලිස්පතිගේ විශේෂ අවසරයක් ලබාගත යුතුය.

2. උසස් පෙළ ප්‍රතිඵල මත ඉඳුරාම බඳවා ගන්නා සහ සීමිත පදනම මත බඳවාගන්නා ලද නිලධාරින් වෘත්තිය පුහුණුව සාර්ථකව නිම කරන තෙක් අදළ තනතුරේ ස්ථිර කිරීම අත්හිටවනු ලැබේ. සීමිත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරින් වෘත්තිය පුහුණුව සාර්ථකව නිම කිරීමට අපොහොසත් වුවහොත් කාලානුරූපව පෙරලා කලින් සිටි නිළයට යවනු ලැබේ. (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරීන් සඳහා අදළ නොවේ.)

3. තෝරාගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනටමත් සම්පාදිතව පවත්නා සහ මින්මතු ඒ සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලබන නියෝග වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කල යුතුය. (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරින් සඳහා අදළ නොවේ.)

4. ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, ජාතික පොලිස් කොමිෂන් සභා චක්‍රලේඛ හා විධිවිධාන, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, පොලිස් නියෝග, පොලිස්පති චක්‍රලේඛ, අත්පොත් සහ උපදෙස් සංග්‍රහවල විධිවිධානවලට යටත් විය යුතුය.

5. අ.පො.ස. උසස් පෙළ සුදුසුකම් මත ඉඳුරාම බඳවා ගන්නා නිලධාරින්/නිලධාරිණියන් සහ සීමිත පදනම මත බඳවා ගන්නා ලද නිලධාරින්/නිලධාරිණියන් වෘත්තීය පුහුණුව නිමා කිරීමෙන් පසුව වෘත්තිය සහතිකය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලැබුණු දින සිට අවුරුදු 15ක අනිවාර්ය සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතුය. (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරින් සඳහා අදළ නොවේ.)

6. අනිවාර්ය සේවා කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු/නිලධාරිණියකු තනතුරින් ඉල්ලා අස්වීමට අදහස් කරන්නේ නම්, ඔහුගේ/ඇයගේ පුහුණුව සහ නිළ ඇඳුම් ඇතුළු අනෙකුත් වියදම් වෙනුවෙනුත් නියම කරනු ලබන මුදලක් වෙතොත් ඒවා සියල්ල ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම ගෙවීමට කැමැත්ත පළ කිරීමේ

ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල විධිවිධානයන්ට යටත්ව කටයුතු කරනු ලැබේ. (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරීන් සඳහා අදාළ නොවේ.)

7. ඉඳුරාම බඳවා ගන්නා නිලධාරින්/නිලධාරිණියන් පත්වීම් බාරගැනීමට ප්‍රථම සියලු ණය හා ණය බැඳීම්වලින් නිදහස් වී සිටිය යුතුය. (පොලිස් උපසේවයට බඳවා ගන්නා නිලධාරීන් සඳහා අදාළ නොවේ.)

8. ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් (සහයක සේවා)/කාන්තා උප පොලිස් පරීක්ෂකවරියන් (සහයක සේවා) පුහුණුව ආරම්භ කළ වහාම ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 සහ 1804/2004ට අනුව පොලිස් ආචාරධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා දිවුරුම් දිය යුතුය.

10. *කාර්යක්ෂමතා කඩඉම් :*

| කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යන වග | කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (සේවය ස්ථිර කිරීම) | උප පොලිස් පරීක්ෂක (සහයක සේවා) තනතුරට පත් වී වසර 03ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රයෝගික |
| 02 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | උප පොලිස් පරීක්ෂක (සහයක සේවා) තනතුරට පත් වී වසර 07ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රයෝගික |
| 03 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | පොලිස් පරීක්ෂක (සහයක සේවා) තනතුරට පත් වී වසර 05ක් ගතවීමට පෙර | වාචික, ලිඛිත සහ ප්‍රයෝගික |

11. *භාෂා ප්‍රවීණතාව :*

| *භාෂාව* | *ලබාගත යුතු ප්‍රවීනතාව* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදළ මට්ටමේ ප්‍රවීනතාව ලබාගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදළ නොවේ. |

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-

(*අ*) උප්පැන්න සහතිකය,
(*ආ*) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(*ඇ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(*ඈ*) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(*ඉ*) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(*ඊ*) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13\. 13.1 දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරාගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

13.2 අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14\. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

සී. ඩී. වික්‍රමරත්න,
*වැඩ බලන* පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය

(අඟල් 1 1/2) | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |

**ශ්‍රී ලංකා පොලීසිය**

සහයකසේවා උප පොලිස් පරීක්ෂක සහ කාන්තා උප පොලිස් පරීක්ෂක (විකිරණ ශිල්පී/ඖෂධවේදී/විද්‍යුත් ඛන්තුක රේඛණ ශිල්පී/භෞතචිකිත්සක/වෛද්‍ය රසායනාගාර කාර්මික) තනතුරු

01\. (*අ*) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(*ආ*) නම (මුලකුරු සමග) :————.

(*ඇ*) අයදුම් කරන තනතුර :————.

02\. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03\. පියාගේ සම්පූර්ණ නම :————.

04\. අයදුම්කරු උපන් ස්ථානය :————.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05\. (*අ*) වර්තමාන ලිපිනය :————.
(*ආ*) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඇ*) ස්ථිර ලිපිනය :————.
(*ඈ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඉ*) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(*ඊ*) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :————.
(*උ*) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06\. (*අ*) ජාතිය :————.

(*ආ*) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(*ඇ*) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07\. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.

*වයස* : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————, මාස :————, දින :————.

08\. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09\. *අධ්‍යාපන සුදුසුකම්* : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය) :————.

10\. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11\. විවාහක/අවිවාහක බව :————.

12\. (*අ*) දැනට කරන රැකියාව :————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. ඔබ ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ? :———.
තනතුර හා නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන ලද සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/ මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

තනතුර :———.

දිනය :———.

02-663

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ, I පන්තියේ II ශ්‍රේණියේ සහ I පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2018(I)2020

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ, I පන්තියේ II ශ්‍රේණියේ සහ I පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2018 (I) 2020 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2020 මාර්තු මස 28 දින සහ 2020 මාර්තු මස 29 යන සති අන්ත දිනවල කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 මෙම විභාග 1894/26 සහ 2014.12.26 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පැවැත් වේ.

3.0 ඉහත සඳහන් සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පහත සඳහන් පරිදි වේ. :-

| *අනු. අංකය* | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT I(III) |
| 02. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT I(II) |
| 03. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT I(I) |

4.0 මෙම විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (Online) කරනු ලැබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk වෙබ් අඩවියේ දකුණු පස ඇති ටයිල් මෙනුවෙහි Examination තුළට පිවිස අදළ විභාගය තෝරා ගැනීමෙන් විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම ආරම්භ කළ හැකිය. විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම 2020.02.28 දින පෙ. ව. 8.00 සිට 2020.03.16 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා පමණක් සිදුකළ හැක.

6.0 *විභාග ගාස්තු* - පළමුවනවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර එක් විෂයකට වඩා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 500 ක් ද, එක් විෂයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 300 ක් ද, ලෙස ගෙවිය යුතුය. විභාග ගාස්තු ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk තුළින් ණය කාඩ් පත් (credit cards) මගින් හෝ 'SLIDA' වෙත ගෙවිය යුතු අතර ඒ ගෙවීමට අදාළව ලබාදෙන රිසිට්පතේ අංකය විභාග අයදුම්පතේ අදළ ස්ථානයන්හි ඇතුළත් කළ යුතුය. අදළ තැපැල් කාර්යාලයේ දී 'SLIDA' ගිණුම වෙත මුදල් ගෙවීමේ මෙරට විදුලි මුදල් ඇණවුම් ඉල්ලුම්පත්‍රය (තැ. කා. සි. 85 පිරවීමේ දී, මුදල් ලබා ගන්නා ලෙස 'SLIDA' යන්න ද, මුදල් ලබන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදළ විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න) සංකේත නාමයන් 03 ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතුය.

තව ද, ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුළත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

7.0 Online ක්‍රමයට සම්පූර්ණ කරන ලද අයදුම්පත Submit කළ පසු අදළ අයදුම්කරු වෙත තහවුරු කිරීමේ අංකයක් (Confirmation Number) ලබා දෙනු ලබන අතර එය ඉදිරි විමසීම් කටයුතු සඳහා අයදුම්කරු වෙත තබාගත යුතුවේ. අයදුම්කරුවන් විසින් නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්‍රය මාර්ගගතව (Online) යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන වෙබ් පිටුවේ ඇති උපදෙස් අනුගමනය කිරීමෙන් තමාට හිමි විභාග ප්‍රවේශ පත්‍රය ලබාගැනීමට ඉඩ සැලසෙනු ඇත. එම ප්‍රවේශ පත්‍රය මුද්‍රණය කර දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු /ඇය විසින් ස්වකීය බලය පැවරූ නියෝජ්‍ය නිලධාරියකු වෙතින් තම අත්සන සහතික කරගත යුතුය. එසේ සහතික කරගත් ප්‍රවේශ පත්‍ර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

8.0 අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටලුවක් මතු වුවහොත් ඒ පිළිබඳ විමසීම් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 යන දුරකථන අංකය 2020.02.28 දින සිට 2020.03.16 දින දක්වා සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා විවෘතව ඇත.

9.0 විභාග ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980236 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකිය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* - අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්-කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

12.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකි වේ.

13.0 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කිරීමෙන් අනතුරුව ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරනු ලැබේ. එම ප්‍රතිඵල අනුව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීමේ හා උසස් කිරීම් කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

14.0 *විභාග පරිපාටිය* : එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරීන් සඳහාවන විෂයයන් සහ විෂය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ.

14.1 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහාවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සේවා ව්‍යවස්ථාවේ 13 වැනි උපලේඛනය). මෙම විභාගයට පෙනී සිටීම සඳහා රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| *විෂයය* | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* | *සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා පරිපාලනය | 01 | 100 යි | පැය 03 | 40 |
| මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 02 | 100 යි | පැය 03 | 40 |
| කළමනාකරණය හා සංවිධානය | 03 | 100 යි | පැය 03 | 40 |

14.1.1 ආයතන සංග්‍රහය හා පරිපාලනය (විෂය අංකය - 01) පහත දැක්වෙන කරුණු මත පදනම්වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම

(ii) ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI,XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය

මෙම ප්‍රශ්න පත්‍රය රචනාමය මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

14.1.2 මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය **(විෂය අංකය-02)**

පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයකි.

(*අ*) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, අරමුදල් යන්නෙහි අර්ථය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය, විසර්ජනයේ අරමුණු හා විසර්ජන ක්‍රම, අවිනිශ්චිත අවස්ථා අරමුදල, වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය, රාජ්‍ය ආදායම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය, වොරන්ට් හා අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය, රාජ්‍ය වියදම් කමිටුව, රාජ්‍ය ව්‍යාපාර කමිටුව.

(*ආ*) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ රාජ්‍ය ගිණුම් නිලධාරීන් පත්කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය

(*ඇ*) අභ්‍යන්තර විගණනය

(*ඈ*) රාජ්‍ය වියදම් සැළසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩසටහන් හඳුනා ගැනීම, සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් සැළසුම් කිරීම හා ඇගයීම් හා ප්‍රමුඛතාකරණය, වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම.

(*ඉ*) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය, මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම, පරිපූරක ඇස්තමේන්තු.

(*ඊ*) රජයේ දේපලවල පාඩු හා අත්හැරීම්

(*උ*) විවිධ ගිණුම් කටයුතු

(උ) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යභාරයන් පැවරීම

(එ) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය

(ඒ) රජයේ සැපයුම් ක්‍රියා පරිපාටිය, භාණ්ඩ, සේවා හා වැඩ ලබාගැනීම, ප්‍රසම්පාදන මණ්ඩල හා තාක්ෂණික ඇගයුම් කමිටුවල සංයුතිය, පත්කිරීම, බලතල හා කාර්යභාරය, ප්‍රසම්පාදන ඇගයීමේ ක්‍රියාපරිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල කළමනාකරණය.

මෙම ප්‍රශ්න පත්‍රය රචනාමය මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

14.1.3 කළමනාකරණය හා සංවිධානය **(විෂය අංකය - 03)**

පහත දැක්වෙන කරුණු මත පදනම්වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(අ) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම
(ආ) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටලුවලට අදාළ කර ගැනීම
(ඇ) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්පක්‍රම

මෙම ප්‍රශ්න පත්‍රය රචනාමය මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

14.2 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය. (සේවා ව්‍යවස්ථාවේ 14 වැනි උපලේඛනය). මෙම විභාගයට පෙනී සිටීම සඳහා රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| *විෂයය* | | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* | *සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|---|---|
| කාර්යාල කළමනාකරණය | | 04 | 100යි | පැය 01 | 40 |
| ඉ - රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය | I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ | 05-I | 40යි | පැය 01 | 16 |
| | II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය | 05-II | 60යි | පැය 01 | 24 |

14.2.1 කාර්යාල කළමනාකරණය (විෂය අංකය - 04)
රාජ්‍ය අංශයේ කාර්යාලය මානව හා භෞතික සම්පත් කළමනාකරණය සම්බන්ධව දෙන ලද සිද්ධියක් පදනම් කර ගනිමින් පිළිතුරු සැපයීම.

14.2.2 ඉ - රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය

(a) I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ (විෂය අංකය - 05 -I)
ඉ - රාජ්‍ය ක්‍රමයේ විකාශනය, එහි අවධි, ඉ - රාජ්‍ය මූලික කොටස්, ඉ - සේවා හා ඉ - රාජ්‍ය ව්‍යාපෘති, රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපරිව්‍යුහය, ඉ - රාජ්‍ය සාර්ථක කර ගැනීමේ තීරණාත්මක සාධක, ඉ - රාජ්‍ය කළමනාකරණය, අන්තර් ක්‍රියාකාරී හැකියාව (Interoperability) හා සේවා අභිමුඛ නිර්මිතිය (Service Oriented Architecture) ඉ - රාජ්‍ය සංකල්පවලට ඇතුළත් වේ.

(b) II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය (විෂය අංකය - 05 - II)
තොරතුරු තාක්ෂණ ජීව චක්‍රය, එහි එක් එක් අවස්ථාවල වැදගත්කම හා ඒ සඳහා අවශ්‍ය සම්පත්වල විශේෂතා, තොරතුරු තාක්ෂණ කළමනාකරණයේ මූලික සිද්ධාන්ත, තොරතුරු තාක්ෂණ සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතිවල අවදානම් සහ ඒවා අවම කර ගැනීම තොරතුරු තාක්ෂණ කළමනාකරණයට ඇතුළත් වේ.

14.3 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය. (සේවා ව්‍යවස්ථාවේ 15 වැනි උපලේඛනය). මෙම විභාගයට පෙනී සිටීම සඳහා රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| *විෂයය* | | *විෂය අංකය* | *ලකුණු* | *කාලය* | *සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිය | I. ව්‍යාපෘති වාර්තාව | 06-I | 60 | - | 30 |
| | II. ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම | 06-II | 40 | පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා පිළිතුරු සැපයීම සඳහා කාලය මිනිත්තු 30 | 20 |

14.3.1 ව්‍යාපෘති වර්තාව (විෂයය අංකය - 06-I)
ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ කාර්යාලයන්හි ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රායෝගිකව යොදා ගත හැකි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ක්ෂේත්‍රයට අදාළ වචන පහළොස් දහසකට (15000) නොඅඩු ව්‍යාපෘති වාර්තාවක් සැකසීම.

14.3.2 ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම (විෂයය අංකය - 06 - II)
පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා පරීක්ෂණ මණ්ඩලය විසින් විමසා සිටින ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම.

එක් එක් විභාගයේ එක් එක් විෂයයන් පැවැත්වීමට සැලසුම් කර ඇති කාලසටහන පහත දැක්වේ. ඃ

<table>
<tr><th>අනු අංක</th><th>විභාගයේ නම</th><th colspan="2">විෂයය</th><th>විෂයය අංකය</th><th>දිනය</th><th>වේලාව</th></tr>
<tr><td rowspan="3">01</td><td rowspan="3">ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</td><td colspan="2">ආයතන සංග්‍රහය හා පරිපාලනය</td><td>01</td><td>2020.03.28</td><td>පෙ.ව. 09.00 - ප.ව. 12.00</td></tr>
<tr><td colspan="2">මුදල් රෙගුලාසි හා රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණයය</td><td>02</td><td>2020.03.28</td><td>ප.ව. 12.30 - ප.ව. 3.30</td></tr>
<tr><td colspan="2">කළමනාකරණය හා සංවිධානය</td><td>03</td><td>2020.03.29</td><td>පෙ.ව.09.00 - ප.ව. 12.00</td></tr>
<tr><td rowspan="2">02</td><td rowspan="2">ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</td><td colspan="2">කාර්යාල කළමනාකරණය</td><td>04</td><td>2020.03.29</td><td>පෙ.ව.09.00 - ප.ව. 10.00</td></tr>
<tr><td rowspan="2">ඉ-රාජ්‍ය සංකල්පය හා තොරතුරු තාක්ෂණ කළමනාකරණය</td><td>I වැනි ප්‍රශ්න පත්‍රය - බහුවරණ</td><td>05-I</td><td rowspan="2">2020.03.29</td><td rowspan="2">පෙ.ව.10.30-ප.ව.12.30</td></tr>
<tr><td></td><td></td><td>II වැනි ප්‍රශ්න පත්‍රය - රචනාමය</td><td>05-II</td></tr>
</table>

| අනු අංක | විභාගයේ නම | විෂයය | | විෂයය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|---|
| 03 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතිය | ව්‍යාපෘති වාර්තාව | 06-I | ව්‍යාපෘති වාර්තාව සැකසීම හා භාර දිය යුතු දිනය පිළිබඳවත් ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධවත් අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්කරුවන් වෙත දනුම් දෙනු ලැබේ. *සැ.යු.* අංක 2,063 හා 2018.03.16 දිනැති *ගැසට්* නිවේදනය මගින් I පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අයදුම්පත් කැඳවන ලද නමුත් මෙතෙක් එම විභාගය පැවැත්වීමට ක්‍රියාකර නොමැති බැවින් එම විභාගයට ඉල්ලුම් කරන ලද නිලධාරීන් මෙම විභාගය සඳහා නැවත ඉල්ලුම් කිරීම අවශ්‍ය නොවේ. | |
| | | | ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම | 06-II | | |

15.0 මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙකදී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

එස්. හෙට්ටිආරච්චි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

02-669

---

## රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ, 3 පන්තියේ II ශ්‍රේණියේ, 3 පන්තියේ I ශ්‍රේණියේ, 2 පන්තියේ II ශ්‍රේණියේ සහ 2 පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග- 2018(I) 2020

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ, 3 පන්තියේ II ශ්‍රේණියේ, 3 පන්තියේ I ශ්‍රේණියේ, 2 පන්තියේ II ශ්‍රේණියේ සහ 2 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2018 (I) 2020 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා

සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2020 මාර්තු මස 28 සහ 2020 මාර්තු මස 29 යන සති අන්ත දින වලදී කොළඹදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 (අ) මෙම විභාග 1894/26 සහ 2014.12.26 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පැවැත්වේ.

(ආ) පූර්ව තනතුරේ බඳවා ගැනීම් පටිපාටියේ කාර්යක්ෂමතා කඩඉම් සඳහන්ව නොමැති විට හෝ පත්වීම් ලිපියේ කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ සඳහන් නොවීම මත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් සිටිනම් අදාල පන්තියේ නියමිත ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම ඉහත සේවා ව්‍යවස්ථාව *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට වසර තුනක (03) සහන කාලයක් තුලදී සම්පූර්ණ කළ යුතුය.

3.0 ඉහත සඳහන් සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පහත සඳහන් පරිදි වේ. ：

| අනු අංකය | විභාගයේ නම | සංකේත නාමය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT 3 III |
| 02. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT 3 II |
| 03. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 වන පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT 3 I |
| 04. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT 2 II |
| 05. | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLICT2 I |

4.0. මෙම විභාගය සම්බන්ධව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

5.0 මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (Online) කරනු ලැබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිලවෙබ් අඩවිය වන www.slida.lkවෙබ් අඩවියේ දකුණු පස ඇති ටයිල් මෙනුවෙහි Examination තුළට පිවිස අදාල විභාගය තෝරා ගැනීමෙන් විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම ආරම්භ කළ හැකිය. විභාග අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම 2020.02.28 දින පෙ.ව. 8.00 සිට 2020.03.16 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා පමණක් සිදුකළ හැක.

6.0 *විභාග ගාස්තු* - පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර එක් විෂයකට වඩා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 500 ක්ද, එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 300 ක් ද, ලෙස ගෙවිය යුතුය. විභාග ගාස්තු ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (උප තැපැල් කාර්යාල හැර) හෝ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.slida.lk තුළින් ණය කාඩ් පත් (credit Cards) මගින් හෝ ''SLIDA'' වෙත ගෙවිය යුතු අතර ඒ ගෙවීමට අදාළව ලබා දෙන රිසිට්පතේ අංකය විභාග අයදුම්පතේ අදාළ ස්ථානයන්හි ඇතුළත් කළයුතු ය. අදාළ තැපැල් කාර්යාලයේදී ''SLIDA'' ගිණුම වෙත මුදල් ගෙවීමේ මෙරට විදුලි මුදල් ඇණවුම් ඉල්ලුම් පත්‍රය (තැ. කා. සි. 85 පිරවීමේ දී මුදල් ලබා ගන්නා ලෙස ''SLIDA''යන්නද, මුදල් ලබන්නාගේ ලිපිනය යන ස්ථානයේ ඔබට අදාල විභාගයේ සංකේත නාමය ද සටහන් කරන්න.) සංකේත නාමයන් 03 ඡේදයේ දක්වා ඇති පරිදි විය යුතුය.

තවද ගිණුම වෙත මුදල් ගෙවීමේදී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නමද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකයද, ඇතුළත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය.

7.0 Online ක්‍රමයට සම්පූර්ණ කරන ලද අයදුම්පත Submit කළ පසු අදාළ අයදුම්කරු වෙත තහවුරු කිරීමේ අංකයත් (Confirmation Number) ලබා දෙනු ලබන අතර එය ඉදිරි විමසීම් කටයුතු සඳහා අයදුම්කරු වෙත තබාගත යුතු වේ. අයදුම්කරුවන් විසින් නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්‍රය මාර්ගගතව (Online) යොමු කිරීමෙන් අනතුරුව ලැබෙන වෙබ් පිටුවේ ඇති උපදෙස් අනුගමනය කිරීමෙන් තමාට හිමි විභාග ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. එම ප්‍රවේශ පත්‍රය මුද්‍රණය කර දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු/ඇය විසින් ස්වකීය බලය පැවරූ නියෝජ්‍ය නිලධාරියෙකු වෙතින් තම අත්සන සහතික කර ගත යුතුය. එසේ සහතික කරගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

8.0 අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳ විමසීම් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 යන දුරකථන අංකය 2020.02.28 දින සිට 2020.03.16 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා විවෘතව ඇත.

9.0 විභාග ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය. අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980236 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකිය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* - අපේක්ෂකයන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකි වේ.

13.0 විභාග ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කිරීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරනු ලැබේ. එම ප්‍රතිඵල අනුව අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීමේ හා උසස් කිරීම් කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු වේ.

14.0 *විභාග පරිපාටිය* : එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරින් සඳහා වන විෂයයන් සහ විෂයය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ. :

14.1 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සේවා ව්‍යවස්ථාවේ 8 වැනි උපලේඛනය) මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඒකාබද්ධ සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| විෂයය | විෂයය අංකය | ලකුණු | කාලය | සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | 01 | 100 යි | පැය 01 | 40 |
| මුදල් රෙගුලාසි | 02 | 100 යි | පැය 01 | 40 |

14.1.1 ආයතන සංග්‍රහය (විෂයය අංකය - 01)

ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති සංග්‍රහය සම්බන්ධයෙන් රජයේ නිලධාරීයා සතු මූලික දැනුම පරීක්ෂා කිරීම මෙහි අපේක්ෂාව වේ. ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

14.1.2 මුදල් රෙගුලාසි (විෂයය අංකය - 02)

රජයේ කාර්යාලවල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව මූලික දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ මූලික දැනුම මැනීම අපේක්ෂා කෙරේ. ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

14.2 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සේවා ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනය) මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඒකාබද්ධ සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු* |
|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 03 | 100 යි | පැය 02 | 40 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 04 | 100 යි | පැය 03 | 40 |

14.2.1 කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය (විෂය අංකය - 03)

රජයේ කාර්යාලයන්හි භාවිතා කෙරෙන කාර්යාල ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමද අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

14.2.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (විභාග අංකය - 04)

රජයේ කාර්යාලයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සාමාන්‍ය සංකල්ප සහ තොරතුරු තාක්ෂණය මනාසේ උපයෝගී කර ගැනීම පිළිබඳව දැනුම මෙමගින් පරීක්ෂා කෙරේ. (රජයේ ආයතනයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා වන ආකාරය, පරිගණක ජාල සහ දත්ත සන්නිවේදනය පිළිබඳ මනා දැනුම, පොදු කාර්ය මෘදුකාංග පිළිබඳ දැනුම සහ විශේෂිත භාවිත මෘදුකාංග, දත්ත සුරැකුම් පිළිබඳ සහ මෘදුකාංගවල සුරක්ෂිත භාවය සහ පරිගණක පද්ධතිවල අඛණ්ඩ සේවාව ලබා ගැනීම හා දත්ත සුරක්ෂිත භාවය වර්ධනය සඳහා ගත හැකි මූලික ක්‍රියා මාර්ග)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

I වන කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 01 කි. (ලකුණු 40 යි)

II වන කොටස - රචනාමය ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 02කි. (ලකුණු 60 යි)

14. 3 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සේවා ව්‍යවස්ථාවේ 10 වැනි උපලේඛනය) මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඒකාබද්ධ සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| විෂයය | විෂය අංකය | ලකුණු | කාලය | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 05 | 50 යි | පැය 01 | 20 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ප්‍රායෝගික පරීක්ෂණය) | 06 | 50 යි | පැය 01 | 20 |

14.3.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ලිඛිත පරීක්ෂණය (විෂය අංකය - 05)

i. කාර්යාලීය කටයුතු සඳහා මෘදුකාංග භාවිතය හා ඒ පිළිබඳ දැනුම
ii. පරිගණක ජාල පිළිබඳ දැනුම
iii. පරිගණක මෘදුකාංගයන්හි/දෘඩාංගයන්හි දෝෂ හඳුනාගැනීම සහ ඒවා නිරාකරණය කිරීම පිළිබඳ දැනුම

මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා රචනා ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

14.3.2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ප්‍රායෝගික පරීක්ෂණය (විෂය අංකය - 06)

i. කාර්යාලීය කටයුතු සඳහා මෘදුකාංග භාවිතයේ ප්‍රායෝගික දැනුම
ii. පරිගණක ජාල පිළිබඳ ප්‍රායෝගික දැනුම
iii. පරිගණක මෘදුකාංගයන්හි/දෘඩාංගයන්හි දෝෂ හඳුනාගැනීම සහ ඒවා නිරාකරණය කිරීම පිළිබඳ දැනුම

14.4 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සේවා ව්‍යවස්ථාවේ II වැනි උපලේඛනය) මෙම විභාගයට පෙනීසිටීම සඳහා ඒකාබද්ධ සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| විෂයය | විෂය අංකය | ලකුණු | කාලය | සමත් වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | 07 | 100 යි | පැය 02 | 40 |
| මුදල් රෙගුලාසි | 08 | 100 යි | පැය 02 | 40 |

14.4.1 ආයතන සංග්‍රහය (විෂය අංකය - 07)

ආයතන සංග්‍රහයේ විධිවිධාන/රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සම්බන්ධයෙන් නිලධාරියා සතු සාමාන්‍ය දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. ආයතන සංග්‍රහයෙහි I වැනි, II වැනි වෙළුමෙහි අඩංගු පරිච්ඡේදවලින් හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

14.4.2 මුදල් රෙගුලාසි (විෂය අංකය - 08)

රජයේ කාර්යාලවල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න

වලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

14.5 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය. (සේවා ව්‍යවස්ථාවේ 12 වැනි උපලේඛනය) මෙම විභාගයට පෙනීසිටීම සඳහා ඒකාබද්ධ සේවයට අයත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයන් විය යුතු වේ.

| විෂයය | විෂය අංකය | ලකුණු | කාලය | සමත් වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටි | 09 | 100 යි | පැය 02 | 40 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා ඉ- රාජ්‍ය | 10 | 100 යි | පැය 03 | 40 |

14.5.1 කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටි (විෂය අංකය - 09)
රජයේ කාර්යාලයන්හි භාවිතා කෙරෙන කාර්යාල ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සහ ඒවා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමද අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න සහ ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

14.5.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඉ- රාජ්‍ය (විෂය අංකය - 10)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

I වන කොටස - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 01 යි (ලකුණු 40 යි)

II වන කොටස - රචනාමය ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 02 කි. (ලකුණු 60 යි)
(ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.)
මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි සකස් කෙරේ.

(අ) තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ජීව චක්‍රයේ මූලික කොටස් වන ක්‍රම අධ්‍යයනය, පද්ධති විශ්ලේෂණය, පද්ධති නිර්මාණය, ඒ සඳහා මෘදුකාංග සංවර්ධනය, ඒවා පරීක්ෂාව, පරිශීලක භාර ගැනීම් පරීක්ෂාව ආදියද ඒවාට අදාලවන තාක්ෂණික ක්ෂේත්‍ර වන ඇල්ගොරිදම්ස්, HTML, XTML, php දත්ත හා තොරතුරු ආරක්ෂාව, ව්‍යසන හේතුවෙන් නැවත පද්ධති ස්ථාපනය, බුද්ධිමය දේපල හිමිකම හා මෘදුකාංග බලපත්‍ර නිදහස් හා විවෘත මූලාශ්‍ර මෘදුකාංග, වෙබ් 2.0 ආදිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කොටසට ඇතුළත් වේ.

(ආ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය රාජ්‍ය අංශයට යොදා ගැනීමේ ක්‍රමවේද, රාජ්‍ය සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදාගෙන වඩා කාර්යක්ෂමව ඉටු කිරීම , ඉ- රාජ්‍ය ක්‍රම සඳහා මූලික තාක්ෂණික අවශ්‍යතා, රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපරිව්‍යුහයක මූලික අංග, ඉ- රාජ්‍ය පද්ධතියක මූලික අංග, අන්තර් ක්‍රියාකාරී හැකියාව (Interoperability)ආදිය ඉ- රාජ්‍ය කොටසට අයත් වේ.

එක් එක් විභාගයේ එක් එක් විෂයයන් පැවැත්වීමට සැලසුම්කර ඇති කාලසටහන පහත දැක්වේ.

| අනු අංකය | විභාගයේ නම | විෂයය | විෂය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආයතන සංග්‍රහය | 01 | 2020.03.29 | පෙ.ව. 9.00 - පෙ.ව. 10.00 |
| | | මුදල් රෙගුලාසි | 02 | 2020.03.29 | පෙ.ව. 10.30 - පෙ.ව. 11.30 |
| 02 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය | 03 | 2020.03.28 | ප.ව. 12.30 - ප.ව. 2.30 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 04 | 2020.03.28 | පෙ.ව. 9.00 - ප.ව. 12.00 |
| 03 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 05 | 2020.03.28 | පෙ.ව. 9.00 සිට පෙ.ව 10.00 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ප්‍රායෝගික පරීක්ෂණය) | 06 | 2020.03.28 | පෙ.ව. 10.30 - පෙ.ව. 11.30 |

| අනු අංකය | විභාගයේ නම | විෂයය | විෂය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 04 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආයතන සංග්‍රහය | 07 | 2020.03.29 | පෙ.ව. 9.00 - පෙ.ව. 11.00 |
| | | මුදල් රෙගුලාසි | 08 | 2020.03.29 | පෙ.ව. 11.30 - ප.ව. 1.30 |
| 05 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ I ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටි | 09 | 2020.03.29 | ප.ව. 12.30 - ප.ව. 2.30 |
| | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ හා ඉ- රාජ්‍ය | 10 | 2020.03.29 | පෙ.ව. 9.00- ප.ව. 12.00 |

15.0 මෙම විභාග නිවේදනයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

16.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

එස්. ආලෝක බණ්ඩාර,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 14 වැනි දින,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

02-670

---

**ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය**

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

**ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2020/21**

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 (රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට වයස් සීමාව 45ට නොවැඩි විය යුතුය) අතර සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

1.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේ දී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සම්මාන 03ක් සහිතව සමත් විය යුතුය.

තවද, ඔහු හෝ ඇය,

(අ) පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාසලක යටත් පිරිසෙයින් මාස 06 පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,

හෝ

(ආ) ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හෝ සිවිල් ආරක්ෂක අංශයේ පුහුණු කිරීමේ ආයතනයක, පාසලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම,

හෝ

(ඇ) පාසල් ක්‍රීඩා ගුරුවරයකු හෝ ගුරුවරියක් වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශකවරයෙකු හෝ උපදේශකවරියක් වශයෙන් හෝ යටත් පිරිසෙයින් වසර 05ක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ දක්ෂතාවයක් දක්වා තිබීම.

හෝ

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයකු විය යුතු අතර කිසියම් ජාත්‍යන්තර තරගයකට සහභාවී තිබීම.

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික්ක මට්ටම් තරගයක දී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ *නැතහොත්* ජාතික ක්‍රීඩා සංගමයකින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයකදී ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථානය ලබා තිබිය යුතුය.

1.2 නියමිත ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. *අයදුම්පත් එවීමේ ක්‍රමය :-*

2.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8" x 13 1/2" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2020.03.27 වන දිනට හෝ ඊට පෙර අධ්‍යක්‍ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

2.2 අයදුම්පත බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ ''2020 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයැදුම්පත'' යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

2.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. එසේ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. *තෝරාගැනීම :*

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයැදුම්පත් අතරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

4. *පාඨමාලාව පිළිබඳ විස්තර :*

4.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05කින් සමන්විත වේ.

(අ) පුහුණුවීමේ සාමාන්‍ය සිද්ධාන්ත ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්‍ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණුවීම් ක්‍රම, සැලසුම් ක්‍රම භාරය හා පරීක්‍ෂණ පිළිබඳ මූලධර්ම සහ වාචික පරීක්ෂණයකින් සමන්විත වේ.

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩාවලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ කාන්තා හෝ පිරිමි අය සඳහා අවස්ථානෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය

(ඉ) ක්‍රීඩා කායික විද්‍යාව, ක්‍රීඩා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලන, ක්‍රීඩා සංඛ්‍යානය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ක්‍රීඩා ජීව රසායන විද්‍යාව, ක්‍රීඩා පෝෂණය සහ ක්‍රීඩා මනෝවිද්‍යාව වැනි පොදු විෂයයන් පිළිබඳ දැනුම.

4.2 පාඨමාලාවේ කාලසීමාව මාස 12කි.

4.3 මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන, අයදුම්කරුවන් විසින් රු. 60,000.00 ක මුදලක් පාඨමාලා ගාස්තු වශයෙන් පාඨමාලා ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතු අතර පාඨමාලා සඳහා බඳවා ගනු ලබන්නේ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අපේක්‍ෂකයන් පමණි. එමෙන්ම මෙම මුදල චෙක්පතකින් ගෙවන්නේ නම් ''ලේකම්, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය'' යනුවෙන් සටහන් කළ යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවෙන් ආපසු ගෙවනු නොලැබේ.

4.4 පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

4.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ''ක්‍රීඩා ඩිප්ලෝමා'' සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

5. *අනෙකුත් කොන්දේසි :*

5.1 පාඨමාලාව අවසානයේදී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

5.2 එසේකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්‍ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

5.3 පවතින ඉහළම සුදුසුකම් හෝ ඉල්ලා ඇති සුදුසුකම් අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර සඳහන් නොකරන ලද දත්ත පසුව ඉදිරිපත් කළ ද බාරගනු නොලැබේ.

5.4 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේනම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්‍ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

අධ්‍යක්‍ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
100/7, නිදහස් මාවත,
කොළඹ 07.

*ආදර්ශ අයදුම් පත්‍රය*

**ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය**

*ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2020*

01. (i) සම්පූර්ණ නම :————. මයා./මිය./මෙනවිය
(ii) මුලකුරු සමග නම :————.
(iii) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි භාෂාවෙන් කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |

(iv) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. ලිපිනය (i) පෞද්ගලික :————.
(ii) රාජකාරී :————.

03. දුරකථන අංකය (පෞද්ගලික) :————. දුරකථන අංකය (රාජකාරී) :————.

(i) උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

(ii) 2020.03.27 දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

04. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? නැතිද? යන වග :————.

05. පුරවැසියෙක් නම්, ලියාපදිංචි වීමෙන්ද? පරම්පරාවෙන්ද? යන වග :————.

06. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

(ii) විවාහක/අවිවාහක බව :————.

07. ඔබ රැකියාවක් කරයි ද? / නොකරයි ද? යන වග :
(i) තනතුර :————.
(ii) සේවා කාලය :————.
(iii) සේවා ස්ථානය :————.

08. (i) අධ්‍යාපන සුදුසුකම් - අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය :

වර්ෂය : [ ][ ][ ][ ] විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථයන්* | *විෂයය* | *සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ඃ

වර්ෂය ඃ | | | | |

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(iii) වෙනත් අධ්‍යාපන සුදුසුකම් (උසස් විභාග/උපාධි)

වර්ෂය ඃ | | | | |

විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

08. ක්‍රීඩා දක්ෂතාවයන් (ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න. සියලුම සහතිකපත්වල ඡායා පිටපත් අමුණා එවන්න.) ඃ

1. ජාතික මහා ක්‍රීඩා උළෙලේ දක්ෂතා දිස්ත්‍රික්/පළාත්/ජාතික :

.............................................................................................................
.............................................................................................................

2. ජාතික සංගම් මගින් පවත්වනු ලබන ජාතික තරගවල දක්ෂතා :

.............................................................................................................
.............................................................................................................

3. ජාත්‍යන්තර තරග සඳහා සහභාගීත්වය :

.............................................................................................................
.............................................................................................................

09. (i) *ගැසට්* නිවේදනය 1.1 ඡේදයේ දක්වා ඇති කුමන ඡේදය යටතේ ඉල්ලුම් කරන්නේ ද යන්න දක්වන්න.

| අ | ආ | ඇ | ඈ | ඉ |
|---|---|---|---|---|
| | | | | |

(ii) ඉහත දක්වා ඇති එම ඡේදයේ විස්තරවී ඇති පරිදි ලබා ඇති සුදුසුකම් පිළිබඳ විස්තර. :

..........................................................................................................

..........................................................................................................

10. වෙනත් කරුණු :

..........................................................................................................

..........................................................................................................

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත් රු. 60,000 ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සුදනම් ද, යන වග :

..........................................................................................................

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

**රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි**

අධ්‍යක්ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය.

මෙම ............................................ සේවය කරන ....................... වන ................................... මහතා/මහත්මිය/මෙනවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව :

නම :————.

තනතුර :————.

දිනය :————.

02-686

## සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

### සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2019 වර්ෂය

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සිසු හෙද පුහුණුව සඳහා බඳවාගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ්අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

| *සංකේත අංකය* | *සේවාව* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|---|
| 01 | හෙද | හෙද නිලධාරි | වසර 03 | ඉංග්‍රීසි |

අංක 01 වගුව

02. *අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් :-*

| *අ.පො.ස (සා. පෙළ) සුදුසුකම්* | *අ.පො.ස (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|
| සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | 2017 හෝ 2018 යන වර්ෂවලින් එකක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);<br><br>හෝ<br><br>2017 හෝ 2018 යන වර්ෂවලින් එකක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) | 2020.03.31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.<br><br>උස අඩි 04 යි, අඟල් 10 කට (147.3 CM) නොඅඩු විය යුතු ය.<br><br>අවිවාහක විය යුතු ය.<br><br>ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |

3. සිසු හෙද පුහුණුවට අදාළ කරුණු :

3.1 සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් සිදුකරනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවා ගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම් කරගනිමින් සිදුකරනු ලැබේ.)

3.2 දිවයිනෙන් සිසු හෙද පුහුණුවට බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාල දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති හෙද සේවයට අයදුම්කර තිබෙන මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජීව විද්‍යා විෂය ධාරාව හා භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ හෙද සේවයට අයදුම්කර අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවට සාමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළ එක් එක් විෂය ධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.5 එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% ක් පිරිමි අයදුම්කරුවන්ගෙන් ද, 95%ක් ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන්හි එක් එක් විෂය ධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

4. *පොදු කරුණු* :

4.1 ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතු ය.;

4.2 සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශයක සේවය ලබාදීම සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

4.3 තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.4 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

4.5 මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

4.6 පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලද හොත් ඔබ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට එකඟ විය යුතු ය.

4.7 තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරග න්නා අවසන් දිනය වන 2020.03.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. එය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

*සටහන* :-
යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ විවාහ වීම මත හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අපේක්ෂකයකුට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

4.8 යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

5. *වෙනත් කරුණු* :

5.1 මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම් කර, පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. (5.2)

5.2 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි ව සිටියේනම් හෝ සිටින්නේ නම්, මෙම පාඨමාලාවට ලියාපදිංචි කරනු ලබන දිනය වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

5.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

5.4 2020.03.31 වැනි දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද, යම් හෙයකින් ඉහත පුහුණු පාඨමාලාව සඳහා ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචි වී සිටියේ නම් ඔහු/ඇය ද උක්ත පුහුණු පාඨමාලාව සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.

5.5 සෞඛ්‍ය, සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි

වී සිටින අයදුම්කරුවන් මෙම පුහුණුවට තේරී පත්වුව හොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව එළඹ ඇති ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් ඉහත පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

5.6 ඉහත කොන්දෙසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන් ම ඔබ අයදුම් කරන මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන් ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

5.7 අධ්‍යාපන සුදුසකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2020.03.31 වැනි දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

6. *අයදුම්කළ යුතු ක්‍රමය* ඃ

6.1 ඉහත පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ්අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතු ය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි ද දක්වා ඇත.

6.2 අයදුම්කරුවන්/අයදුම්කාරියන් රු.500.00ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට ගෙවිය යුතු ය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කළ හැකි ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

6.3 මෙලෙස ඔබ විසින් සාර්ථකව උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි පිටපත් තැපැල් මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට අවශ්‍ය නොවේ. එහෙත්, අයදුම්පත උඩගත කිරීමෙන් අනතුරුව ලැබෙන අංක 5 කින් යුත් කේතය, මුද්‍රිත පිටපත් පසුව ලබා ගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාග න්න. එසේම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (PRINT OUT) ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොදා අත්සන සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් රැගෙන ආයුතුය. (7 වැනි කොටස බලන්න.)

*සටහන* ඃ-අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඔබට යම් ගැටළුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් සතියේ වැඩකරන දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 අතර කාලය තුළ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 693 955 ඇමතීමෙන් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකි ය.

7. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම ඃ-

7.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විශ්වයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 512,148.00කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතු ය.

7.2 රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම, මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබා ගත යුතු ය.

7.3 මෙම නිවේදනයේ දක්වෙන නියමයන්ට අනුකුල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සම්මුඛ පරීක්ෂණයකට ඔබ කැඳවුම් ලැබුවහොත් ඔබ විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු ඃ-

8.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර (UPLOAD) ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද සේවා ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ හෙද නිලධාරි තනතුරු වෙනුවෙන් දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි *මුල් පිටපත්* ඉදිරිපත් කළ යුතු ය.

8.2 විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (ඔබගේ අත්සන සහතික කරන ලද).

8.3 උප්පැන්න සහතිකය.

8.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල සහතිකය හා Z අගය දක්වෙන ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

8.7 බැංකුවට මුල් ගෙවූ ලදුපත.

8.8 ඉහත දක්වෙන පරිදි පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

8.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50.00ක මුද්දරයක් මත අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක්.

8.10 විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ /සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ පාඨමාලාවක ලියාපදිංචි වී හෝ සහභාගි නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.

*සටහන* :

(අ) තවද, ඉහතින් සඳහන් (8.3) සිට (8.7) දක්වා ලේඛනයන්හි මුල් පිටපත්වලට අමතරව සත්‍ය බවට තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතු ය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, සෞඛ්‍ය, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඈ) සම්මුඛ පරීක්ෂයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් පිළිබඳ තොරතුරු http:// www.health.gov.lk වෙබ්අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

9\. *පුහුණු කිරීමේ පරිපාටිය* :

9.1 සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් /අයදුම්කාරියන් අතුරින් තෝරා ගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් හෙද පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුලත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

9.2 තෝරාගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

9.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළි වුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

9.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

9.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවය යටතේ හෙද නිලධාරි තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. ඉහත (9.3) කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැර ගියහොත්, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ, තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඔහුට/ ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියදම් හා ගිවිසුම්ගත මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය, සේවා සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අය කර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

9.6 මෙම පාඨමාලාව සඳහා අයදුම්කරන අයදුම්කරුවන්/අයදුම්කාරියන් අයදුම්පත් යොමු කරන දිනය වන විට අවිවාහක විය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

10\. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :

10.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී, එහෙත් පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත ස්ථාන මාරු ලබා

දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පුහුණුව සාර්ථකව නිමකර අවසන් පරීක්ෂණය සමත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සළකා බලනු ලැබේ. එමෙන්ම තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත් වේ.

10.2 පුහුණු කාලය අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

10.3 අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැළකිළිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල ද ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

10.4 තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් මෙම පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අසමත් වන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

10.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍ර ලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

10.6 පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

10.7 මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරනු ඇත.

10.8 පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

හදානී ජයවර්ධන,
ලේකම්,
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

02-693